2021 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂය සඳහා එදිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රධාන විශ්වවිද්‍යාලය හා ත්‍රිකුණාමල මණ්ඩපය යන දෙකින්ම සමන්විත වේ.

1.5 නිකුත් කිරීම සඳහා අවසරය ලබා දුන් දිනය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ලබාදීම සඳහා අවශ්‍ය අනුමැතිය 2021 මාර්තු 26 දින පැවති 321 වන පාලක සභා රැස්වීම මගින් ලබාදී ඇත.

1.6 මූල්‍ය කාලපරිච්ඡේදය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලපරිච්ඡේදය මාස 12 කින් සමන්විත වන අතර එය 2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා වේ.

2 <u>ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය</u>

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට පිළියෙළ කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථාවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) හා ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (IPSASS) අනුගමනය කර ඇත. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශන 2003 දෙසැම්බර් 19 දිනැති අංක පීඊඩී/19 දරණ චක්‍රලේඛය මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු විසින් හදුන්වාදෙන ලද හා 2004 ජනවාරි 23 දිනැති අංක 2/2004 මුදල් චක්‍රලේඛය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආදේශ කර ගන්නා ලද චක්‍රලේඛය මගින් හදුන්වාදුන් ආකෘතින් හි සුදුසු වෙනස්කම් සහිතව ඉදිරිපත් කර ඇත.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

2.2.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් හා ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් යනාදියෙන් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව පිළියෙල කර තිබේ.

2.2.2 අගය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

2.2.3 සංසන්දනාත්මක තොරතුරු

මෙම කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන තේරුම්ගැනීම හා සංසන්දනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණාත්මක, සාරාංශගත හා විස්තරාත්මක තොරතුරු ඇතුලත්ව පෙර වර්ෂවලට අදාලව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියළුම වටිනාකම් සඳහා සංසන්දනාත්මක වටිනාකම් හෙලිදරව් කර ඇත. අවශ්‍ය අවස්ථාවන්හිදී මෙම වර්ෂයේ ඉදිරිපත් කිරීම් සඳහා අනුකූල වන පරිදි සංසන්දනාත්මක වටිනාකම් නැවත ඉදිරිපත් කර ඇත.

2.2.4 මෙහෙයුම් හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මෙහෙයුම් හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. වෙනත් අයුරකින් සඳහන් කර ඇති අවස්ථාවලදී හැර ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියළුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට ඉදිරිපත් කර ඇත.

2.2.5 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු පරිවර්තනය කිරීම

ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් ව්‍යවහාර මුදලින් සිදුකරනු ලබන ගනුදෙනු, ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති සත්‍ය විනිමය අනුපාතිකය මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ. වාර්තා කරන දිනට විදේශ ව්‍යවහාර මුදලින් පෙන්නුම් කරනු ලබන මූල්‍ය වත්කම් (සුරැකුම්ද ඇතුලත්ව) හා වගකීම් එදිනට පවත්නා හුවමාරු අනුපාතය මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් ඓතිහාසික පිරිවැයට පෙන්නුම් කරනු ලබන මූල්‍ය නොවන වත්කම් හා වගකීම් ගනුදෙනුව සිදුවූ දිනට පැවැති විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. උපලබ්ධි වූ හා උපලබ්ධි නොවූ විනිමය වෙනස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුලත් කරනු ලැබේ.

2.2.6 ප්‍රමාණාත්මක බව හා ඒකරාශී කිරීම

ප්‍රමාණාත්මක බවින් යුත් සමාන අයිතම ඇතුලත් සෑම අයිතම වර්ගයන්ම වෙන වෙනම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවය හෝ ක්‍රියාවලිය අනුව අසමාන අයිතමයන් ඒවා ප්‍රමාණාත්මක නොවේ නම් හැර වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.3 වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම

2.3.1 දේපල පිරියත හා උපකරණ

අ. හඳුනා ගැනීම හා අගය කිරීම

සියළුම දේපල, පිරියත හා උපකරණ ආරම්භයේ දී ඒවා පිරිවැයෙන්, සමුච්චිත ක්ෂය හා අපහායන පාඩු අඩුකල වටිනාකමට පෙන්නුම් කරනු ලැබේ.

වත්කම ප්‍රධාන උපාංග වෙන වෙනම හඳුනාගෙන ක්ෂය කිරීමට කටයුතු කර ඇත. දේපල, පිරියත හා උපකරණ වල සැලකිය යුතු උපාංග ප්‍රතිෂ්ඨාපනය කරන අවස්ථාවන්හිදී අස්ථිත්වය විසින් එහි ප්‍රතිෂ්ඨාපනය කරන උපාංගයේ වටිනාකම ඉවත්කර අළුතින් ප්‍රතිෂ්ඨාපනය කරන උපාංගයෙන් වටිනාකම හඳුනාගෙන එහි ඵලදායී ජීවකාලය සැලකිල්ලට ගෙන ක්ෂයකිරීම් කරනු ලැබේ.

අනෙකුත් සියළුම අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

ආ. පිරිවැය

දේපල, පිරියත හා උපකරණ, එහි ගැනුම් මිල සහ අදාල වත්කම අපේක්ෂිත කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට පත් කිරීම දක්වා දැරූ සෘජු පිරිවැයෙන් සමන්විතවේ.

දේපල, පිරියත හා උපකරණ එහි දෛනික සේවා පිරිවැය හැර ඒවයේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත අපහායන පිරිවැය අඩු කල පිරිවැයට පෙන්නුම් කරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණවල කොටසක් ප්‍රතිෂ්ඨාපනය කරන අවස්ථාවන්හිදී අදාල කොටස්වල පිරිවැය, පිරිවැය හඳුනාගැනීමේ නිර්ණායක සමග එකඟ වේනම් අදාළ පිරිවැය දැනුම් අවස්ථාවේදීම වත්කමේ පිරිවැය හඳුනාගනු ලැබේ.

ඇ. එකතු කිරීම්

අයිතමය හා බැඳුණු ආර්ථික ප්‍රතිලාභ අනාගතයේ දී විශ්වවිද්‍යාලය තුලට ගලා ඒමේ භව්‍යතාවයක් තිබේනම් සහ එම පිරිවැය විශ්වාසදායිව මැනිය හැකිනම් දේපල, පිරියත හා උපකරණ අයිතමයක පිරිවැය වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ. බොහෝ අවස්ථාවන්හිදී දේපල, පිරියත හා උපකරණ එහි පිරිවැයට හඳුනාගනු ලැබේ. කිසියම් වත්කමක් පරිත්‍යාගයක් ලෙස ලැබුනේනම් අදාල වත්කම අත්පත් කරගත් දිනයට පැවති සාධාරණ අගයට හඳුනාගනු ලැබේ.

ඈ. ඉවත් කිරීම්

අපහරනය කිරීම තුලින් ලද ශුද්ධ ලැබීම්, වත්කමේ ධාරණ අගය සමග සංසන්දනය කර අපහරනය කිරීම තුලින් ලද ලාභ හෝ අලාභ නිර්ණය කරනු ලබන අතර එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුලත් කරනු ලැබේ.

ඉ. පසුව දරන පිරිවැය

අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලාඒමේ හෝ අයිතමයේ සේවා සැපයීමේ ධාරිතාවය වැඩි වීමේ සම්භාවිතාවයක් පවතීනම් සහ අයිතමයේ පිරිවැය නිවැරදි ලෙස මැනිය හැකිනම් වත්කම් අත්පත් කර ගැනීමේදී දරන පිරිවැයට පසුව දරන පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණවල උපාංගයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා දරන පිරිවැය ඒවායේ මූලික පරීක්ෂා කිරීමේ වියදම්, හා අලුත්වැඩියා කිරීමේ වියදම්ද ඇතුලත්ව ප්‍රාග්ධනිත කෙරේ. අනෙකුත් පසුව දරනු ලබන වියදම් අදාල උපාංගය තුලින් අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලය තුලට ගලාඒමේ හැකියාවක් පවතී නම්හා එම පිරිවැය විශ්වාසදායිව මැනිය හැකිනම් ප්‍රාග්ධනිත කරනු ලැබේ.

ඊ. ක්ෂය කිරීම්

ඉඩම් හැර අනිකුත් දේපල, පිරියත හා උපකරණසරල මාර්ග ක්‍රමය යටතේ එහි ඵලදායී ජීවිත කාලය තුළ ක්ෂය කරනු ලැබේ.

1995 ඔක්තොම්බර් 05 දිනැති අංක 649 දරණ වි.වි.ප්‍ර.කො.ස චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් වීවායේ පිරිවැය මත පහත අනුපාත යටතේ ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

ගොඩනැඟිලි	-	05%
කාර්යාල ලී බඩු	-	10%
යන්ත්‍ර හා පිරියත	-	10%
කාර්යාල උපකරණ	-	20%
පොත් හා වාර සඟරා	-	20%
වාහන	-	20%
උපාධි ලෝගු	-	20%
දුරකථන	-	20%

විශ්වවිද්‍යාලයේ ක්ෂයකිරීමේ ප්‍රතිපත්තියට අනුව, වත්කම් ක්ෂයකිරීම ආරම්භවන්නේ කිසියම් වත්කමක් අදාල අපේක්ෂිත කාර්යයට සුදුසු තත්ත්වයට පත්වූ පසුවේ. එනම් අදාල වත්කම කළමනාකරණය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියාත්මක කිරීමේ තත්වයට සහ ස්ථානයට පත් කිරීම දක්වා වේ. වත්කමක් ඉවත්කරන අවස්ථාවේදී අදාල වත්කම ක්ෂයකිරීම අවසන් කරනු ලැබේ.

උ. ඉවත් කිරීම

වත්කමක් ඉවත්කිරීමේදී හෝ අදාල වත්කම භාවිතයෙන් හෝ අපහරණය කිරීමෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කරන අවස්ථාවලදී අදාල වත්කම හඳුනාගනු නොලැබේ. වත්කමක් ඉවත් කිරීමෙන් ලැබෙන ශුද්ධ ලැබීම් හා වත්කමේ ධාරණ අගය අතර වෙනස ඉවත්කිරීමේ ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගන්නා අතර එම ලාභය හෝ අලාභය වත්කම ඉවත්කිරීම සිදුවූ වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පෙන්නුම් කරනු ලබයි.

2.3.2 කෙරිගෙන යන වැඩ

කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැයෙන් කිසියම් අපහායන පාඩුවක් වෙතොත් එය අඩුකර පෙන්නුම් කරනු ලැබේ. මේවා ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වන අතර දේපළ, පිරියත හා උපකරණ ඉදිකිරීම් වෙනුවෙන් සෘජුවම දරනු ලබන අතර ප්‍රාග්ධනිත කිරීම සඳහා අපේක්ෂාවෙන් පවතින වීවායේ කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ දේපල, පිරියත හා උපකරණවලට අදාල වත්කම් කාණ්ඩය සඳහා වීවා භාවිතයට යෝග්‍ය අවස්ථාවට පත්වන විට මාරු කරනු ලැබේ. එනම් අදාළ වත්කම් විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වීමට අපේක්ෂිත තත්ත්වයට හා ස්ථානයට ලඟාවූ විට වේ.

2.3.3 අස්පෘශය වත්කම්

අ. හඳුනා ගැනීම හා මිණුම්කරණය

වත්කමට අදාල අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒ නම් හා වත්කමේ පිරිවැය විශ්වාසදායිව මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ. වෙන වෙනම අත්පත් කරගනු ලබන මුල් අවස්ථාවේදී පිරිවැයට හඳුනාගනු ලැබේ.

මුල් හඳුනාගැනීමෙන් පසුව, පිරිවැය ආකෘතිය අනුගමනය කරන අවස්ථාවලදී, වත්කම් වීවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත අපහායන පාඩු අඩුකල වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

ආ. ක්‍රමක්ෂය

නිශ්චිත ජීවකාලයකින් යුතු සියළුම අස්පෘශ්‍ය වත්කම් සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් එහි පිරිවැය මත අදාල අනුපාතයට හෝ ඵලදායී ජීවිත කාලයට ක්ෂය කරනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම් පහත පදනම් යටතේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

- ස්ථාවර වත්කම්, මෘදුකාංග සරල මාර්ග ක්‍රමයට වර්ෂ පහකට (05) කාලයක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.
- පරිගණක මෘදුකාංග සහ අනෙකුත් අස්පෘශ වත්කම් සරල මාර්ග ක්‍රමය යටතේ වර්ෂ 05 ක කාලයක් තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

ඇ. ඉවත් කිරීම

අස්පෘශ්‍ය වත්කම් ඉවත්කිරීමට අදාල ලාභ හෝ පාඩු අදාල වත්කම ඉවත්කිරීම තුලින් ලද ශුද්ධ ලැබීම් හා අදාල වත්කමේ ධාරණ අගය අතර වෙනස මගින් ගණනය කරන අතර එය වත්කම් ඉවත්කරන අවස්ථාවේදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පෙන්නුම් කරනු ලබයි.

2.3.4 තොග

මූලික හඳුනාගැනීමේදී තොග පිරිවැයට අගය කරනු ලැබේ. මුදල් හුවමාරු නොවන ගනුදෙනුවක් තුලින් තොග ලැබෙන අවස්ථාවක, තොගයේ පිරිවැය වනුයේ අත්පත් කර ගත් දිනට තොගයේ සාධාරණ වටිනාකම වේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, තොග ප්‍රථම් ලැබීම ප්‍රථම් නිකුත් කිරීම් (ප්‍ර.ලැ.ප්‍ර.නි) ක්‍රමයයටතේ ගණනය කරනු ලබන අතර අධ්‍යයන/ පරිපාලන දෙපාර්තමේන්තුවල ඉතිරි වී ඇති තොගය තොග ගණනයේදී සැලකිල්ලට ගනු නොලැබේ.

2.3.5 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, ඇමතුම මත තැන්පතු සහ මාස 03ක් හෝ ඊට වඩා අඩු කල්පිරීමේ කාලයක් සහිත ඉතා ඉහළ ද්‍රවශීල ආයෝජන යනාදියෙන් සමන්විත වන අතර මේවා පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි අතර වටිනාකම වෙනස්වීමේ සුළු අවදානමක් පමණක් පවතී.

වක්‍ර ක්‍රමය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී බැංකු අයිරාව, මුදල් හා මුදල් සමාන දෑ වල කොටසක් ලෙස ඇතුලත් කරනු ලැබේ.

2.4 වගකීම් සහ වෙන්කිරීම්

2.4.1 වගකීම්

ඉල්ලන ඕනෑම අවස්ථාවක ගෙවිය යුතු හෝ වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් ඇතුලත ගෙවා නිදහස් කලයුතු ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ජංගම නොවන වගකීම් වනුයේ වාර්තා කරන දිනයේ සිට වර්ෂයක කාලයකට පසුව ගෙවිය යුතු ශේෂයන් වේ. දන්නා සියළු වගකීම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් ගත කර ඇත.

2.4.2 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට දෛනිකව හෝ සම්මුතිකව බැඳීමක් පවතින විට එම බැඳීම නිරාකරණය කිරීමේදී ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් පිටතට ගලායාමේ භාවයතාවයක් පවතීනම් හා බැඳීමේ ප්‍රමාණය විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ හැකිනම් ප්‍රතිපාදනයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. අනාගත මෙහෙයුම් අලාභ සඳහා වෙන්කිරීම් සිදු කරනු නොලැබේ. ප්‍රතිපාදන ලෙස පෙන්නුම් කර ඇති සමහර මෙහෙයුම් හිමිකම් සඳහා ඒවායේ ස්වභාවය සහ අවිනිශ්චිතතාවය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවේ.

අ. සේවක ප්‍රතිලාභ

I. පාරිතෝෂික වෙන් කිරීම

සුදුසුකම්ලත් සියළුම සේවකයන් සඳහා පාරිතෝෂික වෙන් කිරීම 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව සිදුකරනු ලබයි. බාහිර ආයෝජනයන් සිදුකිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් මුදල් වෙන් නොකරන බැවින් පාරිතෝෂික වෙන් කිරීමට අදාල ආයෝජනයක් පවත්වාගෙන යනු නොලැබේ.

II. නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු පශ්චාත් - සේවා සැලැස්මක් වන අතර මේ යටතේ අස්ථිත්වයක් කිසියම් ස්ථාවර දායකත්වයක් වෙනත් අස්ථිත්වයක් සඳහා ගෙවනු ලබන අතර මීට අමතරව වෙනත් කිසිදු මුදලක් ගෙවීම සඳහා නෛතික හෝ සම්මුතික බැඳීමක් නොපවතී.

නිශ්චිත දායකත්ව සැලැස්මක් සඳහා දායකත්වය බැඳීම ඒවා ගෙවිය යුතු කාලපරිච්ඡේදයට අදාලව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්නුම් කරනු ලැබේ.

- **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (වි.වි.අ.අ)**
  විශ්වවිද්‍යාල සේවකයන්ගේ මාසික වැටුපෙන් 10% ක දායකත්වයක් විශ්වවිද්‍යාලඅර්ථසාධක අරමුදලට දායක කල යුතු අතර විශ්වවිද්‍යාලය විසින් මූලික වැටුපෙන් 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට හා 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක කරනු ලබයි.

- **සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (සේ.නි.භා.අ)**
  විශ්වවිද්‍යාලය විසින් සියළුම සේවකයන්ගේ මාසික වැටුපෙන් 3% ක මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කරනු ලැබේ.

2.4.3 අසම්භාව්‍ය වගකීම්

සම්පත්හා බැඳුණු ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාම හෝ සේවා විභවය දුරස්ථ වේ නම් හැර විශ්වවිද්‍යාලය අසම්භාව්‍ය වගකීමක් හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වල කිසියම් අසම්භාව්‍ය වගකීමක් වේ නම් එය හෙළිදරව් කරනු ලැබේ.

2.4.3 අසම්භාව්‍ය වත්කම්

විශ්වවිද්‍යාලය අසම්භාව්‍ය වත්කම් හඳුනා නොගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ පාලනයෙන් තොර අනාගත සිදුවීමක් හෝ සිදුවීම් ඇතිවීම හෝ ඇති නොවීම මත ඇති විය හැකි වත්කම් සම්බන්ධයෙන් වන තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් යටතේ අනාවරණය කරනු ලැබේ.

2.5 අරමුදල්, ප්‍රදාන හා සංචිත සඳහා ලැබීම් හා උපයෝජනය සඳහා ගිණුම්කරණය

2.5.1 සීමිත අරමුදල්

කිසියම් හඳුනාගත් ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකමක් සඳහා ප්‍රදාන/ පරිත්‍යාග ලැබුණු විට ඒවා සීමිත අරමුදල් ගිණුම්වල පවත්වාගෙන යනු ලැබේ. උපයෝජනය කර නොගත් අරමුදල් ඒවා අවශ්‍ය වන තෙක් අදාල අරමුදල් ගිණුම්වල පවත්වාගෙන යන අතර ඒවා සමුච්චිත අරමුදල හෝ සංචිත ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්නුම් කරනු ලැබේ.

විශ්වවිද්‍යාලය පහත සඳහන් අරමුදල් හා ප්‍රදාන ගිණුම්ගත කර ඇත.

අ. පර්යේෂණ ප්‍රදාන

ප්‍රධාන මධ්‍යස්ථානය - (ශ්‍රී.ලං.නැ.වි.වි)

- පර්යේෂණ ප්‍රදාන - සාමාන්‍ය
- පර්යේෂණ ප්‍රදාන - ආධුනික හා ජේෂ්ඨ අධ්‍යයන ශ්‍රේණි සඳහා දේශීයව ආචාර්ය උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා
- උසස් අධ්‍යාපනය සඳහා ජාතික මධ්‍යස්ථානය - පර්යේෂණ ප්‍රදාන
- පර්යේෂණ සංවර්ධන අරමුදල

ආ.ස්වයං මූල්‍ය උත්පාදිත වැඩසටහන්

ප්‍රධාන මධ්‍යස්ථානය - (ශ්‍රී.ලං.නැ.වි.වි)

- බාහිර අධ්‍යයන - ශාස්ත්‍රවේදී
- බාහිර අධ්‍යයන - ව්‍යාපාර පරිපාලනවේදී
- බාහිර අධ්‍යයන - ශාස්ත්‍රවේදී
- බාහිර අධ්‍යයන - කෘෂිකර්ම විද්‍යාවේදී
- බාහිර අධ්‍යයන - විද්‍යාවේදී
- බාහිර අධ්‍යයන - හෙද විද්‍යාවේදී
- පශ්චාත් උපාධි වැඩසටහන් - කලා හා සංස්කෘත (ශාස්ත්‍රපති, දර්ශනපති, අධ්‍යාපනපති)
- පශ්චාත් උපාධි වැඩසටහන් - විද්‍යාවේදී
- පශ්චාත් උපාධි අධ්‍යයන - (වාණිජ්‍ය හා කළමනාකරණ, කළමනාකරණ පශ්චාත් ඩිප්ලෝමා)
- පශ්චාත් උපාධි අධ්‍යයන - (වාණිජ්‍ය හා කළමනාකරණ, ව්‍යාපාර පරිපාලනවේදී)
- තිරසාර කෘෂිකර්මය හාසම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය(CENSARM)
- තිරසාර කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

ත්‍රිකුණාමල මණ්ඩපය

- සීමිත අරමුදල්

2.5.2 වෙනත් ප්‍රදාන

ප්‍රධාන මධ්‍යස්ථානය - (ශ්‍රී.ලං.නැ.වි.වි)

- පුස්තකාලය තුල වෙන්කිරීමේ හා සංරක්ෂණය කිරීමේ ඒකක පිහිටුවීම සඳහා වි.වි.ප්‍ර.කො.ස ප්‍රදාන
- පරිගනක සංවර්ධන අරමුදල
- ස්වාමි විපුලානන්ද අනුස්මරණ දේශන අරමුදල ආයෝජනය කිරීමෙන් ලද පොලිය
- පරිත්‍යාග අරමුදල් ආයෝජනයෙන් ලද පොලිය
- කෙටිකාලීන ආයෝජන තුලින් ලද පොලිය
- පරිත්‍යාග අරමුදල් ගිණුම
- උපකුලපති අරමුදල
- ස්වාමි විපුලානන්ද අනුස්මරණ දේශන අරමුදල
- පරිත්‍යාග ශිෂ්‍යත්ව ආධාර කරුවන්ගේ කොටස
- ව්‍යවසාය සංවර්ධන හා ගෘහ කර්මාන්ත සඳහා වි.වි.ප්‍ර.කො.ස ප්‍රදාන (ව්‍යවසාය හැකියාවන් සංවර්ධනය)
- ශිෂ්‍ය සුබසාධන අරමුදල
- සුනාමි ශිෂ්‍යත්ව ප්‍රදාන - 2012
- පුනරුත්ථාපන ප්‍රදාන
- තිරසාර කෘෂිකර්මය හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය (CENSARM)
- ශ්‍රී ලංකා ක්‍රීඩා සංගමයේ අරමුදල් ප්‍රදාන
- මධ්‍යගත ඉගැන්වීම් සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සදහා වි.වි.ප්‍ර.කො.ස ප්‍රදාන
- ආසියා පදනම
- ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම
- SEDRIC @ ශ්‍රී ලංකා ව්‍යාපෘති පදනම
- පර්යේෂණ යොජනා ලිවීම සහ පර්යේෂණ ආචාරධර්ම පිළිබඳ වැඩමුළුව සඳහා අරමුදල - සෞ.අ.වි පීඨය
- NTNUසම්බන්ධ ව්‍යාපෘතිය (NUFU අරමුදල)
- NUFUසම්බන්ධ ව්‍යාපෘතිය, NUFU අරමුදල (පොදුකාර්ය වියදම් සඳහා අයකිරීම් 10%)

ත්‍රිකුණාමල මණ්ඩපය

- ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය
- වාහන සඳහා ප්‍රදාන
- වි.වි.ප්‍ර.කො.ස ලද තොරතුරු තාක්ෂණ ප්‍රදානය
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

2.6. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2.6.1 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදාන වලින් පුනරාවර්තන ප්‍රදාන සමන්විත වේ.

2.6.2 වෙනත් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ ආදායම/ පාඩුව

විශ්වවිද්‍යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලා සහ වැඩසටහන් මගින් ශුද්ධ ආදායම/ පාඩුව හඳුනාගනු ලැබේ. ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සඳහා පවත්වනු ලබන ස්වයං මූල්‍ය උත්පාදිත පාඨමාලාවල ආදායම් සහ වියදම් මුදල් පදනම මත හඳුනාගැනේ. මෙම කටයුතු වලට අදාල ශුද්ධ ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පෙන්නුම් කරන අතර පසුව පොදු සංචිතයට ගැලපීම සිදුකෙරේ. එසේම ශුද්ධ ආදායම/ ඌනතාවය අදාල ගිණුම්වල ආරම්භක ශේෂයට ගලපා ජංගම වගකීම් යටතේ සීමිත අරමුදලට ගලපා පෙන්නුම් කෙරේ. පහත පාඨමාලාවලින් සහ වැඩසටහන් වලින් ලද ආදායම/ ලාභය විශ්වවිද්‍යාලය විසින් ගිණුම්ගත කරනු ලැබේ.

අ. බාහිර අධ්‍යයන පාඨමාලා
ආ.පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා - වාණිජ හා කළමනාකරණ
ඇ.පශ්චාත් උපාධි පාඨමාලා - කලා හා සංස්කෘත
ඈ.පශ්චාත් උපාධි පාඨමාලා - කෘෂිකර්මය
ඉ. පශ්චාත් උපාධි පාඨමාලා - විද්‍යා
ඊ. ඩිප්ලෝමා - කෘෂිකර්මය
උ. බාහිර අධ්‍යයන වලින් ආදායම - ත්‍රිකුණාමල මණ්ඩපය

2.6.3 ශිෂ්‍ය ගාස්තු ගිණුම්ගත කිරීම

විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය වන ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු, පාඨමාලා ගාස්තු සහ වෛද්‍ය ගාස්තු මුදල් පදනම මතත් වෙනත් ආදායම් ලැබිය යුතු පදනම මතත් ගිණුම්ගත කරයි.

2.6.4 වියදම් හඳුනාගැනීම

විශ්වවිද්‍යාලය විසින් ව්‍යාපෘති පවත්වාගෙන යාම සහ අනෙකුත් ක්‍රියාකාරකම් වෙනුවෙන් දරනු ලබන වියදම්, එම වියදම් දරනු ලබන කාලසීමාව සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. විශ්වවිද්‍යාලය පරිපාලනය කිරීම හා පවත්වාගෙන යාම වෙනුවෙන් දරනු ලබන වියදම් සහ අපේක්ෂිත මට්ටමින් ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම වෙනුවෙන් දේපල, පිරියත හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය කිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් දරනු ලබන පිරිවැය උපචිත පදනමට ගිණුම්ගත කරන අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම සිදු කෙරේ.

2.6.5 මූල්‍ය වියදම්

ගෙවීම් සිදුකල අවස්ථාවේ හෝ වගකීම් ඇතිවූ අවස්ථාවේදී මූල්‍ය පිරිවැය හඳුනාගනු ලැබේ.

2.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත."වක්‍ර ක්‍රමය" භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත. ලැබුණු ප්‍රාග්ධන ආධාර මූල්‍ය මුදල් ප්‍රවාහ ලෙස වර්ග කර ඇත.

2.8 වාර්තාකරන දිනට පසුව ඇතිවූ සිදුවීම්

වාර්තාකරන දිනට පසුව ඇතිවූ ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්ථාවන්හිදී අදාල ගැලපීම් ගිණුම්වල සිදුකර ඇත.

2.9 වෙනත් හෙළිදරව්කිරීම්

2.9.1 මහපොළ හා ශිෂ්‍යාධාර සඳහා ප්‍රදාන

ශිෂ්‍යාධාර සඳහා ලැබෙන ප්‍රදාන පුනරාවර්තන ප්‍රදාන යටතේ ආදායමක් ලෙසින් පෙන්වන අතර ශිෂ්‍යාධාර ගෙවීම් 1987-10-14 දිනැති යූජීසී/විෆ්/ඛී.යු.ආර්/87 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපිය මගින් උපදෙස් ලබා දී ඇති පරිදි සුභසාධන සේවා ලෙසින් 4.3.7.1705 යටතේ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයේ ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහයන් ලෙස වෙනම අයිතමයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

2.9.2 විසිවන සියවස සඳහා උසස් අධ්‍යාපනය (ඒච්.ර්.ටී.සී) ව්‍යාපෘතිය

ලෝක බැංකුව විසින් පී.පී.ඩී.යූ හරහා අරමුදල් සම්පාදිත ඒච්.ඊ.ටී.සී. ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යන අතර අදාල ගිණුම් පී.පී.ඩී.යූ වෙත වරින් වර ඉදිරිපත් කරනුලැබේ.

මෙම ව්‍යාපෘතිය මගින් මිලදී ගනු ලබන වත්කම් විශ්වවිද්‍යාලයේ දේපල ලෙස සලකන අතර ව්‍යාපෘතිය අවසානයේ ගිණුම් ගත කරනු ලැබේ.

5 අවුරුදු සංඛ්‍යා ලේඛන

වර්ගය		2017	2018	2019	2020	2021	% වෙනස 2017-2021	% වෙනස 20120-2021
සිසුන් සංඛ්‍යාව	එකතුව	4659	5299	6186	7326	7851	40.7%	6.7%
	කෘෂිකර්මය	299	275	250	262	308	2.9%	14.9%
	කලා හා සංස්කෘත	1812	2305	2828	3149	2863	36.7%	-10.0%
	වාණිජ්‍ය හා කළමනාකරණය	682	681	682	730	844	19.2%	13.5%
	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා	427	511	522	686	778	45.1%	11.8%
	විද්‍යා	543	481	510	544	647	16.1%	15.9%
	තාක්ෂණය	86	144	221	289	396	78.3%	27.0%
	ව්‍යවහාරික විද්‍යාව	126	217	320	465	564	77.7%	17.6%
	දේශීය වෛද්‍ය ඒකකය	139	181	216	278	344	59.6%	19.2%
	සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයනය	545	504	637	923	1107	50.8%	16.6%
කාර්යය මණ්ඩල සංඛ්‍යාව	එකතුව	699	729	676	718	749	6.7%	4.1%
	අධ්‍යයන	230	244	205	262	274	16.1%	4.4%
	අධ්‍යයන සහායක	19	24	26	26	26	26.9%	0.0%
	පාලන	30	39	41	39	41	26.8%	4.9%
	අනධ්‍යයන	420	422	404	391	408	-2.9%	4.2%
ඉගැන්වීම් කාර්යය මණ්ඩලය	එකතුව	223	237	246	255	267	16.5%	4.5%
	ජේෂ්ඨ මහාචාර්ය	-	2	3	2	2	-	0.0%
	මහාචාර්ය	9	8	7	10	15	40.0%	33.3%
	ආශ්‍රිත මහාචාර්ය	-	-	-	1	3	-	66.7%
	ජෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය	57	61	69	78	81	29.6%	3.7%
	ජෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	71	85	80	78	67	-6.0%	-16.4%
	කථිකාචාර්ය	86	81	87	86	99	13.1%	13.1%
උපාධි අපේක්ෂක	එකතුව	5146	5711	6652	8083	8407	38.8%	3.9%
	අභ්‍යන්තර	4659	5299	6176	7326	7851	40.7%	6.7%
	බාහිර	487	412	476	757	556	12.4%	-36.2%
පශ්චාත් උපාධි	එකතුව	192	186	227	266	362	47.0%	26.5%
ප්‍රකාශන	වෙබ් විද්‍යා	15	15	24	73	166	91.0%	56.0%
	ග්‍රන්ථ/ග්‍රන්ථ පරිච්ඡේද	22	30	18	12	14	-57.1%	14.3%
සම්මාන	ජනාධිපති සම්මාන	4	2	3	2	-	-	-
අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්	එකතුව	2	1	1	-	-	-	-

2021 වර්ෂය සඳහා විගණන කමිටු සභාපතිගේ වාර්තාව

විගණන කමිටුව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ උප කමිටුවලින් එක් කමිටුවකි. සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත කමිටුව සෑම වර්ෂයකම නිරන්තරයෙන් රැස්වන අතර විශ්වවිද්‍යාලයේ මූල්‍ය, මානව සහ පරිපාලන යන අංශයන් පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. විගණන කමිටුවේ සාමාජිකත්වය, රාජකාරී කොන්දේසි, වගකීම්, බලතල හා තෝරාගැනීමේ ක්‍රියාපටිපාටිය ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාව හා වි.වි.ප්‍ර.කොා.ස මඟින් මහාභාණ්ඩාගාරය විසින් පාලනය කරනු ලබයි.

1. විගණන කමිටුවේ කාර්යභාරය

i. අභ්‍යන්තර විගණන අංශයේ වගකීම් නිශ්චය කිරීම හා වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම
ii. විශ්වවිද්‍යාලයේ සියළුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම හා ඇගයීම
iii. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණක විසින් සකස් කරනු ලබන වැඩ සටහන පූර්වාදර්ශනය කර නිර්දේශ කිරීම
iv. පිරිවැය ඵලදායිතාවය සහ අනවශ්‍ය වියදම් කපා හැරීම යනාදිය සඳහා නියමිත කාල සීමාවන් හිදී කාර්යසාධනය සමාලෝචනය කිරීම
v. බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධීකරණය කරමින් විගණකාධිපති/ බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපි පිළිබඳ පසු විපරම් කිරීම
vi. අඥාපනත්, රෙගුලාසි, නීති සහ චක්‍රලේඛ වලට අනුකූලද යන්න නිර්ණය කිරීම
vii. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සනාථකර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම
viii. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අභ්‍යන්තර/ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම
ix. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ කිරීම්/ මගපෙන්වීම් ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම
x. වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයා ගැනීම් පිළිබඳ වාර්තාවක් සකස් කිරීම

2. විගණන කමිටුවේ සංයුතිය

පහත සාමාජිකයන් සමාලෝචිත වර්ෂය තුලදී අඛණ්ඩව සේවය කරන ලදි.

සාමාජිකයාගේ නම	**තනතුර**
අ. පාලක සභාව විසින් පත්කරන ලද සාමාජිකයන්	
1. ප්‍රේමනාත් මයා (සභාපති)	නීතිඥ
2. ආචාර්ය පී. සකුනන්	සෞඛ්‍ය සේවා ප්‍රාදේශීය අධ්‍යක්ෂක, කල්මුණේ
3. එස්. ජේ. එම්. එස් සමරකෝන් මිය	පීඨාධිපති, මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාලය
ආ. නිල බලයෙන් පත් වන නිලධාරීන්	
4. ඒ. පහිදරන් මයා	ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
5. එස්. තිරුවරුද්චෙල්වන්	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගනක
ඇ. නිරීක්ෂකයන්	
6. එම්.එච්.එම්. අරෆාත් මයා	විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය, මඩකලපුව
7. එම්. එම්. ජේ. ආර්. බෝගමුව මයා	අභ්‍යන්තර විගණක, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
ඈ.ආරාධිත	
8. එම්. එම්. ෆාරිස් මයා	මූල්‍යාධිකාරී, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

3. රැස්වීම්

රටේ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී තෙවතාවක් පමණ රැස්වීමට කමිටුවට හැකියාව ලැබුණි. කමිටුවේ නිර්දේශ අනුමත කිරීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාලක සභාවට ඉදිරිපත් කරන ලදි. රැස්වීම් පිළිබඳ විස්තරය පහත දැක්වේ.

රැස්වීම් අංකය	රැස්වීමේ දිනය
1. 68 වන	25.02.2021
2. 69 වන	30.11.2021
3. විශේෂ රැස්වීම	14.12.2021

4. 2020 වර්ෂය තුල ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළදී කමිටුව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

අ. අභ්‍යන්තර විගණනය:

- **අභ්‍යන්තර විගණන සැලැස්ම නිර්දේශ කිරීම හා අධීක්ෂණය කිරීම**
  පූර්ව අත්දැකීම් අනුව කමිටුව විසින් විගණන සැලැස්මේ පහත අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලෙස නිර්දේශ කරන ලදි.
  - වත්කම් උපයෝජනය
  - විභාග ප්‍රතිඵල ප්‍රමාදවීම
  - බැඳීම් හා ගිවිසුම් කඩකිරීම
  - වාහන අලුත්වැඩියාවන් පවත්වාගෙන යාම
  - වාර්ෂික ස්ථාවර සත්‍යාපනය හා ස්ථාවර වත්කම් සත්‍යාපනය
  - පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම

එසේම කමිටුව විසින් වසර පුරාවටම එහි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරන ලදි.

- **අභ්‍යන්තර විගණන කාර්යයන් සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම**
  කමිටුව අභ්‍යන්තර විගණන වාර්තා, විමර්ශන සටහන් සහ විමසුම් සමාලෝචනය කර ඒවායේ පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් හා නිර්දේශ පරිපාලනය වෙත ඉදිරිපත් කරන ලදි.

ආ. වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්

සමාලෝචිතවර්ෂය සඳහා වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේ ප්‍රගතිය කමිටුව විසින් අධීක්ෂණය කරන ලද අතර නියමිත දිනට ඉදිරිපත් කිරීම සහතික කරන ලදි. එසේම කමිටුව විසින් විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පසුවිපරම් කරන ලදි.

ඇ. බාහිර විගණනය

සමාලෝචිත වර්ෂය තුල අදාළ නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල වීමට අදාලව විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සහ විගණන වාර්තාව කමිටුව විසින් සමාලෝචනය කරන ලදි.

ඈ. අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම

- <u>වාර්ෂික සත්‍යාපනය සහ ස්ථාවර වත්කම් ලේඛනය</u>
  නියමිත කාලයට විශ්වවිද්‍යාලය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමේ ප්‍රගතිය කමිටුව නිරන්තරයෙන් සමාලෝචනය කරන ලදි.

- <u>නොපියවූ අත්තිකාරම් හා ණය අයකරගැනීම</u>
  ණය හා අත්තිකාරම් අයකර ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව කමිටුව දැඩි අවධානය යොමු කරන ලද අතරසමාලෝචිත වර්ෂය තුලදී ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය වඩා සමීපව අධීක්ෂණය කරන ලදි.

- <u>ත්‍රිකුණාමල මණ්ඩපයේපුස්තකාලයේ අභ්‍යන්තර පාලන අඩුපාඩු</u>
  ත්‍රිකුණාමල මණ්ඩපයේ පුස්තකාල කළමනාකරණ පද්ධතිය පිළිබඳව කමිටුව දැඩි අවධානයක් යොමු කරන ලද අතර අදාල නිළධාරියා/ නිළධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට පාලක සභාවට නිර්දේශ කරන ලදි.

- <u>පෞද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යෑමේ අඩුපාඩු</u>
  ආයතන අංශය මගින් පෞද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කමිටුව දැඩි අවධානයක් යොමු කරන ලද අතර එහි අඩුපාඩු රාශියක් නිරීක්ෂණය වූ බැවින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලෙස අදාළ නිළධාරීන් දැනුවත් කරන ලදි. එසේම කමිටුව අදාල සේවකයින් සඳහා කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කරන ලදි.

- <u>ප්‍රධාන ගබඩාවේ තොග සත්‍යාපනය</u>
  ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ගබඩාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය ඉතා දුර්වල එකක් බවටත් එහි මෙහෙයුම් අඩුපාඩු රාශියක් ඇති බවටත් කමිටුව නිරීක්ෂණය කරන ලදි. ගබඩාවේ විෂමතාවයන් සොයා බලා ඒවා නිවැරදි කිරීමටත් විසඳුම් ලබාදීමටත් කමිටුවක් පත්කරන ලෙස විගණන කමිටුව නිර්දේශ කරන ලදි.

ඉ. සංයුක්ත සැලැස්ම හා මූලික සැලැස්ම

සංයුක්ත සැලැස්ම

යහපාලනය සම්බන්ධයෙන් වන රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශයන්හි සඳහන් ප්‍රමිතීන්ට අනුව සංයුක්ත සැලැස්ම සකස් කිරීමේ ප්‍රගතිය කමිටුව විසින් නිරන්තරයෙන් සමාලෝචනය හා අධීක්ෂණය කරන ලදි.

ඊ. බැඳීම් හා ගිවිසුම් කඩකිරීම

කමිටුව නිරන්තරයෙන් බැඳීම් අයකර ගැනීම් හා සමාලෝචන කමිටුවේ කටයුතු සමාලෝචනය හා අධීක්ෂණය කරන ලදි. එසේම මෙම කටයුත්ත කරගෙන යාම සඳහා නීති නිළධාරියෙකු පත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස සමහර ගිවිසුම් කඩකල අයගෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබුණි. එසේම ඇපකරුවන් වෙත එන්තරවාසි යැවීම සඳහා වන නීති ක්‍රියාමාර්ගයන් මේ වන විටත් ආරම්භ කර ඇත.

උ. අයවැය පාලනය

නිසි මූල්‍ය පාලනය හා වියදම් කළමනාකරණය සහතික කර ගැනීම සඳහා අයවැයට අනුව සත්‍ය ක්‍රියාකාරිත්වය කමිටුව විසින් දැඩිව නිරීක්ෂණය හා අධීක්ෂණය කරන ලදි.

5. නිගමනය

කමිටුවේ සාමාජිකයන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය හා විශ්වවිද්‍යාලයේ යහපාලනය ස්ථාපිත කිරීම සඳහා ඔවුන්ගේ කැපකිරීම පිළිබඳව විගණන කමිටුව සෑහීමට පත්වේ. කමිටුවේ ලේකම්වරයා වශයෙන් ජ්ෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක විසින් සිය කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් කමිටුව සෑහීමට පත්වේ. කමිටුව විසින් ලබාදුන් නිර්දේශක්‍රියාවට නැංවීම හා එහි ප්‍රගතිය සම්බන්ධයෙන් කමිටුව සෑහීමකට පත්වන අතර යහපාලනය, විනිවිදභාවය, නිසි මූල්‍ය පරිපාලන සහ අධ්‍යයන ක්‍රියාකාරිත්වයක් ස්ථාපිත කරන ලෙස තව දුරටත් අවධාරණය කරනු ලබයි.

සභාපති
විගණන කමිටුව
නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
18.03.2022

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලද තිරසාර සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය වි සින් පරිසරය ආරක්ෂා කිරීම හා පරිසරය මත අහිතකර බලපෑම් අවම ක‍ිරීම සඳහා පරිසරය හා ආපදා ඇගයීම් විශ්ලේෂණය මත පහත තිරසාර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි

සියලු දෙනා සඳහාම දැරිය හැකි, විශ්වාසනිය, කල් පවත්නා සහ නවීන බලශක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම	■ සනාතන ගොඩනැගිල්ල තුළ සූර්ය බල ජාල මැනුම් පද්ධතියක් ස්ථාපිත කරන ලදි. (වසර හයක් තුළ පිරිවැය ආවරණය කරනු ඇත.) මෙය 2018 ජූනි මස සිට බලශක්තිය උත්පාදනය කරනු ලබන අතර (නිපදවූ මුළු ඒකක ගණන 212,000) එය මෙම ගොඩනැගිල්ලේ පරිභෝජනයෙන් 50% හා මුළු පරිභෝජනයෙන් 10% කි. ■ මුළු පරිභෝජනයෙන් 50% කට අධික ප්‍රමාණයක් ආවරණය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සහ ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා සූර්යබල ජාල පද්ධති ස්ථාපිත කිරීම සඳහා සැලසුම් කරමින් පවති.
ආපදා කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම සහ ස්ථාපිත කිරීම	■ අපද්‍රව්‍ය ප්ලාස්ටික්, පොලිතින්, කාබනික ද්‍රව්‍ය, කඩදාසි, වීදුරු සහ ඊ - අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කළ හැකි අතර වෙන වෙනම බහලුම් වලට එකතු කළ හැකිය. මෙය මුලදී නේවාසිකාගාර වලටත් පසුව අනෙකුත් කාර්යාල වලටත් හඳුන්වා දෙනු ඇත.
රසායන ද්‍රව්‍ය හා රසායනික අපද්‍රව්‍ය පරිසර හිතකාමී ආකාරයට බැහැර කිරීම තහවුරු කිරීම	■ උපද්‍රව සහිත රසායන ද්‍රව්‍ය හා සායනික අපද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් විද්‍යා පීඨය හා සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය විසින් නිපදවනු ලැබේ. මෙම අපද්‍රව්‍ය යහපත් ක්‍රමවේදයන් වලට බැහැර කිරීම සඳහා සාකච්ඡා කරමින් පවතී.
විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රම ගවේෂණය කිරීම	■ ප්‍රමාණවත් ඉඩකඩ ඇති බැවින් අපද්‍රව්‍ය විශ්වවිද්‍යාලය තුළ බැර කළ හැකි. පෙව - අපද්‍රව්‍ය පුළුස්සා අලුත් කල හැකි/ ජීවානුහරණය කල හැකි අතර ගොවිපල සඳහා පොහොර ලෙස ද භාවිතා කල හැකිය. කඩදාසි ආහාර යනාදි අනෙකුත් කාබනික අපද්‍රව්‍ය නිර්වායු දිරාපත්වීමකට ලක් කල හැකි අතර නිපදවනු ලබන ජීව වායු බලශක්ති ප්‍රභවයක් ලෙස භාවිතා කළ හැකිය. ■ කෘෂිකර්ම පීඨයට හා විද්‍යා හා තාක්ෂණ පීඨයට ඔවුන්ගේ ප්‍රවීණතාව මත මෙය නියාමනය කල හැකි අතර මඩකලපුව මහ නගර සභාවේ සහයෝග්‍ය හා උපකාරය මේ සඳහා අපේක්ෂා කල හැක.ග
විශ්වවිද්‍යාලය තල විද්‍යුත් - අපද්‍රව්‍ය නිපදවීමේ අවම කිරීම සඳහා මිනුම් ස්ථාපිත කිරීම	■ වාර්ෂිකව සැලකිය යුතු විද්‍යුත් - අපද්‍රව්‍ය ප්‍රමාණය විශ්වවිද්‍යාලය තුළින් හඳුනා ගනු ලැබේ. අපද්‍රව්‍ය අවම කිරීම සඳහා වන එවැනි මිනුම් මේ වන විටත් සාකච්ඡා මට්ටමේ පවතී පවතී.
විශ්වවිද්‍යාලය සඳහා පිරිසිදු හා හරිත සංකල්පයක් හඳුන්වා දීම	■ විශේෂයෙන්ම නේවාසිකාගාර, විශ්වවිද්‍යාල වටපිටාව සහ ගොඩනැගිලි ඇතුලත පිරිසිදු බව පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම සඳහා මිනුම් හඳුන්වාදී ඇත. එසේම විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල අඛණ්ඩව හරිත බව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා අඛණ්ඩව සාකච්ඡා කරමින් පවතී.
නේවාසිකාගාරවල හා අනෙකුත් අත්‍යවශ්‍ය ස්ථානවල ගිනිනිවීම් උපකරණ සවිකිරීම	■ දැනට සනාතන ගොඩනැගිල්ලේ, පුස්තකාලයේ හා පීඨවල ගිනිනිවීම් උපකරණ සවිකර තිබේ. ගින්නෙන් සිදුවන හානි වැළැක්වීම සඳහා නේවාසිකාගාරවලට ගිනිනිවීමේ උපකරණ සවි කිරීමට තීරණය කරන ලදි.
LED ආලෝකකරණ පද්ධතිය යොදා ගැනීම තුළින් බලශක්ති කාර්යක්ෂම උපයෝගී කරගැනීම තහවුරු කරගැනීම	•LED ඉතා ඉහළ ශක්ති කාර්යක්ශම/ බලශක්තිය ඉතිරි කරන ආලෝකකරණ තාක්ෂණයක් වන අතර ඉතා දීර්ඝ කාලයක් පවතින ප්‍රභවයකි. දැනට ආලෝකකරණයෙන් 90% කට ආසන්න ප්‍රමාණයක් LED වන අතර ඉතාම කෙටි කාලයකදී මුළු විශ්වවිද්‍යාලය ම ආවරණය කරනු ඇත.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එම වර්ෂය අවසානයට මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය හා 107 (5) උප වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග පළකල යුතු බවට මා විසින් අදහස් කරනු ලබන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුලත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කලයුතු වාර්තාව ඉදිරියේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මගේ වාර්තාවේ මතය තත්ත්වාගණනය කිරීම සඳහා පදනම ලෙස දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2020 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුලින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් ප්‍රකාශ කරන අතර එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 වන ඡේදයට අනුව සියළු ආදායම් අතිරික්තයට හෝ ඌනතාවයට සලකා බැලිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල කෙටි කාලීන ආයෝජන තුලින් ලද පොලී ආදායම වූ රු. 24,700,208 ක මුදල ආදායමක් ලෙස හඳුනා ගැනීමෙන් තොරව සීමිත අරමුදල් වලට බැර කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) පිරිවැය රු. 105,634,056 ක් වූ වෙනත් වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 50 ඡේදය ප්‍රකාරව කිසියම් අස්තිත්වයක මෙහෙයුම් ක්‍රියාවලිය තුල අදාල වත්කමේ ස්වභාවය හෝ ක්‍රියාකාරිත්වය අනුව වර්ගීකරණය කිරීමෙන් තොරව දේපල, පිරියත හා උපකරණ යටතේ පෙන්නුම් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම්හි ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. රු. 609,026,512 ක් වූ දේපළ පිරියත හා උපකරණ මුළුමනින්ම ක්ෂය කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මෙම ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1986 සිට 2017 කාලසීමාව තුල ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම 2018 සිට 2021 කාලසීමාව තුල ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලද රු. 1,087,500,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව ආදායම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ක්‍රීඩා භාණ්ඩ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මධ්‍යස්ථානයේ හා ත්‍රිකුණාමල මණ්ඩපයේ පැවති ක්‍රීඩා භාණ්ඩ පිළිවෙලින් 10% ක ප්‍රතිශතයකින් හා 20% ක ප්‍රතිශතයකින් ක්ෂය කර තිබුණි. එබැවින් එකතුව රු. 16,159,548 වූ ක්‍රීඩා භාණ්ඩ සමුච්චිත ක්ෂය වටිනාකම සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඊ) විශ්වවිද්‍යාලයේ ස්ථාන 15 ක පවතින හෙක්ටයාර 241.2 පමණක් වන ඉඩම් වටිනාකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) පිරිවැය රු. 23,055,912 ක් වූ ජංගම නොවන වත්කම් අයිතම 275 ක් උසස් අධ්‍යාපනය ව්‍යාප්තය කිරීම වේගවත් කිරීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මඟින් 2019 සිට 2021 කාල පරිච්ඡේදය තුල විශ්වවිද්‍යාලය වෙත භාරදීමට කටයුතු කර ඇති නමුත් මෙම ව්‍යාපෘතිය මඟින් ලබා දී ඇති උපදෙස් වලට අනුව මෙම වත්කම්වල වටිනාකම ගිණුම්වල ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2008 වර්ෂයේදී රු. 3,666,316 ක පිරිවැයට ඉදිරි කර තිබූ ව්‍යාධිවේදී විද්‍යා රසායනාගාරය 2021 දෙසැම්බර් 31 දිනට රු. 2,566,312 වෙනුවට රු. 280,116 ලෙස ක්ෂය කර තිබුණි. මේ හේතුවෙන් සමුච්චිත ක්ෂය වටිනාකම රු. 2,286,196 ක වටිනාකමින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් සටහන් කර තිබුණි.

(එ) විශ්වවිද්‍යාලයේ තවදුරටත් සේවය කරනු ලබන කථිකාචාර්යවරු 09 දෙනකුගෙන් එකතුව රු. 34,042,950 ක් වන ගිවිසුම් කඩ කිරීමෙන් අයවිය යුතු වටිනාකම ලැබිය යුතු දෑ ලෙස ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු. 23,344,060ක් වන පාරිතෝෂික වටිනාකම, පාරිතෝෂික වෙන් කිරීම් ගිණුමට හර කිරීම වෙනුවට පාරිතෝෂික වියදම් ගිණුමට හර කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවයේ වටිනාකම හා පාරිතෝෂික වෙන්කිරීමේ වටිනාකම මෙම ප්‍රමාණයෙන් වැඩිපුර සඳහන් කර තිබුණි.

(ඔ) ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් ඒකකය සඳහා රු. 224,269,514 ක පිරිවැයකට නිමකරන ලද තෙමහල් ගොඩනැගිල්ලක් 2020 අගෝස්තු 27 දින විශ්වවිද්‍යාලයට භාරදී තිබූ නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාග්ධනිත කර නොතිබුණි. මේ හේතුවෙන්, 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය සහ සමාලෝචිත වර්ෂයට ඌනතාවය පිළිවෙලින් රු. 14,913,923 සහ රු. 11,213,476 ලෙස අඩුවෙන් සටහන් කර තිබුණි.

(ඕ) එකතුව රු. 4,060,132 ක් වූ බැංකු ගිණුම් තුනකට අදාල සෘජු හර කිරීම් වටිනාකම වසර 12 ක සිට මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස හඳුනා නොගෙන බැංකු සැසඳුමේහි හඳුනා නොගත් හර කිරීම් ලෙස පෙන්නුම් කර තිබුණි.

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතින්ට අනුකූලව සිදු කෙළෙමි. මෙම ප්‍රමිතීන්ට අනුව මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ වැඩි දුරටත් විස්තර කර ඇත. තත්වාගණනය කළ විගණන මතයක් ඉදිරිපත් කිරීම සඳහා මා විසින් ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍ය පදනමක් සපයන බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්ව විද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුලත් වෙනත් තොරතුරු

විශ්වවිද්‍යාලය 2021 වාර්ෂික වාර්තාවේ ඇතුලත් තොරතුරු වලින් වෙනත් තොරතුරු සමන්විත වන අතර එහි මෙම විගණන වාර්තාව ඉදිරිපත් කිරීමට පූර්ව මා විසින් ලබාගත් මූල්‍ය ප්‍රකාශන මාගේ විගණන වාර්තාවට ඇතුලත් නොවේ. කළමනාකරණය වෙනත් තොරතුරු සම්බන්ධයෙන් වගකීම දරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම වෙනත් තොරතුරු ආවරණය නොකරන අතර මා කිසිදු ආකාරයකින් ඒ සම්බන්ධයෙන් වගකීමක් දරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම ඉහත වෙනත් තොරතුරු කියවීම වන අතර එහිදී එම වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනය තුලදී මා විසින් ලබාගත් දැනුම සමග හෝ වෙනත් ආකාරයකින් ප්‍රමාණාත්මකව වෙනස් ලෙස සටහන් කර තිබේද යන්න සලකා බැලීම සිදු කෙරේ.

විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළ හොත් නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශ්වයන් වෙත එම කරුණු සන්නිවේදන කල යුතුය. තවදුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභා ගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමානාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම සඳහා කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනත 16 (01) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම මාගේ මතය ඇතුලත් විගණන වාර්තාව නිකුත් කිරීම මගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමානාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථානෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විතව මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථානෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී.

ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මා විසින් වෙනත් කරුණු අතුරින් මගේ විගණනය තුලදී හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ ප්‍රධාන දුර්වලතාවයන් ඇතුලත්ව ප්‍රධාන විගණන සොයාගැනීම් ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවය සමඟ සන්නිවේදනය කළෙමි.

2. වෙනත් නෛතික හා රෙගුලාසිමය අවශ්‍යතා

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සඳහා විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මගේ පරීක්ෂාවට අනුව අවශ්‍ය යැයි හැගුණු සියළු තොරතුරු හා පැහැදිලිකිරීම් මා විසින් ලබාගත් අතර විගණන මතය සඳහා පදනම් කරගත් ඡේදයේ සඳහන් කරුණු වලින් මතුවන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තිය අනුව අවශ්‍ය කරන නියමිත ගිණුම් වාර්තා විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන ගොස් ඇත.

2.1.2 2018 අංක 19 දරන විගණන පනතේ 6 (1) (අ) (III) වගන්තිය වගන්තියේ අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂය සමග ඒකාකාරීව ඉදිරිපත් කර ඇත.

2.1.3 මෙම වාර්තාවේ 1.2 (ආ), 1.2 (ඇ), 1.2 (ඉ), ඡේද හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (4) වගන්තිය ප්‍රකාරව මා විසින් පෙර වර්ෂයේදී සිදු කරනු ලැබූ සියළු නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත.

2.2 සිදුකරනු ලැබූ විගණන ක්‍රියාවලි හා ලබාගත් සාක්ෂි ප්‍රමාණාත්මක කරුණු වලට පමණක් සීමා වූ අතර එවැනි කිසිවක් මගේ අවධානයට ලක් වී නොමැත.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ අවශ්‍යතාවය අනුව සාමාන්‍ය ක්‍රියාවලිය තුලදී විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ කිසියම් සාමාජිකයකු සෘජුව හෝ වක්‍රව විශ්වවිද්‍යාලය විසින් වලඹෙන ලද ගිවිසුමකට සම්බන්ධ වී ඇත්නම් ඒ බව සඳහන් කිරීම.

2.2.2 2018 අංක 19 දරන විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවය අනුව පහත කරුණු හැර විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නිකුත් කරන ලද කිසියම් අදාල ලිඛිත නීතියක්, සාමාන්‍ය හා විශේෂ මඟපෙන්වීම් පිළිබඳව අනුගත නොවී ඇත්නම් ඒ පිළිබඳව සඳහන් කිරීම.

නීති/මගපෙන්වීම් සඳහා යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 571 වන මුදල් රෙගුලාසිය	වසර 03 ක සිට වසර 06 ක කාලසීමාවකට අයත් රු. 9,091,397 ක් වූ හෝ රඳවාගැනීමේ මුදල් ශේෂ 19 ක් පියවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර තිබුණි.
(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතන වල ආයතන සංග්‍රහය	
(i) ඡේදය III හි 20.8 උප වගන්තිය හා ඡේදය IV හි 4.1 උප වගන්තිය	පාලක සභාව විසින් 2020 අගෝස්තු 29 දින උද්භිත විද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයකුගේ ඉල්ලා අස්වීම භාර ගෙන තිබුණි. පසුව 2020 සැප්තැම්බර් 02 සිට ක්‍රියාත්මක වන පරිදි මෙම කථිකාචාර්යවරයා නැවත සේවයේ පිහිටුවා තිබුණි. කෙසේ වෙතත් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව රු. 91,310 වන මූලික වැටුප් තලයේ පිහිටුවනවා වෙනුවට රු. 119,520 ක් වන වැටුප් හා වැටුප් තලයක පිහිටුවා ඒකතුව රු. 1,375,407 වන මුදලක්2020 සැප්තැම්බර් 03 සිට 2021 දෙසැම්බර් 31 කාල සීමාව දක්වා ගෙවීමට කටයුතු කර තිබුණි.
(ii) ඡේදය II හි 26.7.2 උප වගන්තිය	වෙනත් උසස් අධ්‍යාපන ආයතන හෝ වෙනත් පිළිගත් ආයතන වලින් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී පුවත්පත් දැන්වීමක් පළ කිරීම අවශ්‍ය වුවත් මෙම උප වගන්තියට පටහැනිව පීඨයේ හෝ අදාල අධ්‍යනාංශයේ අංශාධිපති හෝ පීඨාධිපතිගේ සැලකිල්ල මත පමණක් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි.
(iii) ඡේදය XX හි 3.1 උප වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය	සියලුම කාර්යය මණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සේවයට වාර්තා කිරීම සනාථ කල යුතු වුවද අදින කාර්යය මණ්ඩලය මෙම අවශ්‍යතාවය සමඟ අනුගත වී නොතිබුණි.
(iv) පරිච්ඡේද XXVI හි 2.6 උප වගන්තිය ජාතික පුස්තකාල හා ලේඛන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/ චිල්ඩී/ 01 දරණ චක්‍රලේඛයේ 03 ඡේදය	පිරිවැය රු. 128,861,691 වන පුස්තකාල පොත් හා වාර සඟරා පිළිබඳ භාණ්ඩ සමීක්ෂණයක් ආරම්භයේ සිටම සිදු කර නොමැත.
(v) 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛය මගින් සංශෝධිත පරිච්ඡේද XXVI හි 03 වගන්තිය	සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය පවත්වා එහි වාර්තාව 2022 මාර්තු 17 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2022 ජූලි 18 වන දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2020 වර්ෂයට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මත හා අඹලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම 2002 ජූලි 18 වන දින විටත් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ 2021 ඔක්තෝම්බර් 21 දිනැති නියෝගය හා නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්ගේ 2014 දෙසැම්බර් 09 දිනැති අංක සීඒ/201/2014/ඊයූ/එස්වීල් ලිපියේ 04 ඡේදය	විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ නියෝගයට හා උසාවිය මගින් යෝජිත අදහසට අනුව 2015 ජූනි 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් ලබා දිය යුතු බවත් කථිකාචාර්යවරයකු 2011 ජූලි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජේෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණි මට්ටමට උසස් කිරීමට කටයුතු කර නොතිබූ අතර පුද්ගලික දීමනා ලෙස රු. 3,208,006 ක මුදලක් කථිකාචාර්යවරයාට වැඩිපුර ගෙවීමට කටයුතු කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනත 12 (ඵ) වගන්තියේ අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය විසින් එහි බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2015 වර්ෂයේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන කාර්යය මණ්ඩලය කාර්යය මණ්ඩලය සඳහා නිකුත් කරන ලද ආචාර ධර්ම සහ අධ්‍යයන වගවීමට අනුව අංශ ප්‍රධාන, මහාචාර්ය පුටු, මහාචාර්ය, ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය, උපදේශක - I හා උපදේශක - II යන අයගේ වර්ෂයකට සිසුන් සමඟ සම්බන්ධ වීමේ අවම පැය ගණන ඔවුන්ගේ කාලසටහනේ පිළිවලින් 180, 300, 360, 380, 450, 480 සහ 510 ලෙස පෙන්නුම් කල යුතුය. විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව 2021 වර්ෂය තුල පිඨ06 ක අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 100 දෙනෙකු අතර සිසුන් සමඟ සම්බන්ධ වීමේ පැය 38,580 බෙදා හැරිය යුතුව තිබුණි. නමුත් ඉහත සම්මතයෙන් 47 ක ප්‍රතිශතයක් නියෝජනය වන පැය 17,948 බෙදා වෙන්කර තිබුණි. තවද සිසුන්ගේ පර්යේෂණ සුපරීක්ෂණය සහ කර්මාන්තවලට ස්ථානගත කිරීම, සායනික වැඩ සහ අධ්‍යයන කටයුතු සම්බන්ධීකරණය සඳහා වැඩ බෙදාහැරීමේ සම්මතයන් සනාථ කර ගැනීම සඳහා කිසිදු වාර්තාවක් නොතිබීම හේතුවෙන් මුළු ශිෂ්‍ය ඇමතුම් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු වැඩ ප්‍රමාණය පෙන්නුම් කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් වැඩ කිරීමේ සම්මතයන් මත පදනම්ව මාර්ගෝපදේශයක් දියුණු කර ඇති බවට තහවුරු කරගත නොහැකි විය.

(ආ) රටේ ජාතික ආර්ථිකය හා රැකියා වෙළඳපළට ගැලපෙන පරිදි දැනට පවත්නා විෂයයන් සහ විෂය මාලාවන් යාවත්කාලීන කලයුතු අතර නිරන්තරයෙන් වෙනස්වන රැකියා වෙළඳපලට අනුගත වීම සඳහා තාක්ෂණික විෂයයන් සහ භාෂා හැකියාවන් විෂය මාලාවට ඇතුලත් විය යුතුය. කෙසේ වෙතත්, කෘෂිකර්මය, තාක්ෂණය හා ව්‍යවහාරික විද්‍යා යන පිඨ තුනක විෂයමාලාවන් ආරම්භයේ සිටම සංශෝධනය කර නොතිබුණි.

(ඇ) ව්‍යාපාර කළමනාකරණවේදී බාහිර උපාධි පාඨමාලාවට අදාල ශිෂ්‍ය අත්පොතට අනුව උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම කාලසීමාව අධ්‍යන වර්ෂ 03 කි. කෙසේ වෙතත් 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා වන ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය වසර පහක් තිස්සේ අවසන් කර නොතිබුණි. උපාධි පාඨමාලාව අවසන් කිරීමේ ප්‍රමාදය සිසුන්ගේ රැකියාවන් හා රැකියා කිරීමේ අවස්ථාවන් සඳහා ඉතා අහිතකර ලෙස බලපෑ හැකිය.

(ඈ) බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා මධ්‍යස්ථානය හා කලා හා සංස්කෘත පීඨය මගින් වසර 10 ක් තිස්සේ ශාස්ත්‍රවේදී කලා උපාධිය නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මඩකලපුව දිස්ත්‍රික්කයට අයත් කලාපයේ උනන්දුවක් දක්වන සිසුන්ට පසුගිය වසර 10 ක් තිස්සේ කලාපය තුලම ශාස්ත්‍රවේදී කලා උපාධියක් හැදෑරීමට තිබූ අවස්ථාව අහිමි වූ අතර ඒ වෙනුවට එම සිසුන්ට වෙනත් දිස්ත්‍රික්ක හෝ පළාත්වල පිහිටි විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා හැදෑරීමට සිදුව ඇත. තවද, දර්ශනශූරි දර්ශනපති ඩිප්ලෝමා සහ සහතික ප්‍රත්‍ර යනාදි පාඨමාලා 11 ක් 2018 වර්ෂයේ සිට පැවැත්වීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට රු. 6,247,846 ක මුදලක් 2013 සිට 2015 දක්වා ගෙවීමට කටයුතු කර තිබුණද එය ක්‍රමානුකූලව යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට සමහර ගනුදෙනු ඇතුලත් කර නොතිබුණි. තවද, ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට හා අඩුපාඩු නිවැරදි කිරීමට ක්‍රියාමාර්ගගෙන නොතිබුණු අතර සැලකිය යුතු වෙනස්කම් පවත්නා භෞතික වත්කම් වටිනාකමෙහි, මූල්‍ය ප්‍රකාශනවලට අනුව වත්කම්වල වටිනාකම් සහ ස්ථාවර වත්කම් ලේඛනයට අනුව වත්කම්වල වටිනාකම් නිරීක්ෂණය කරන ලදි. එබැවින්, මෙවැනි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම වෙනුවෙන් දරන ලද වියදම ඵල රහිත බවට පත්ව තිබුණි.

(ආ) විධිමත් ශක්‍යතා අධ්‍යයනයකින් හා ප්‍රමාණවත් ප්‍රතිපාදන වලින් තොරව ත්‍රිකුණාමල මණ්ඩපය සඳහා අභ්‍යන්තර මාර්ගයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ පළමු අදියර 2017 මැයි 02 දින රු. 55,775,000 වටිනාකමට මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රදානය කර තිබුණි. ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 01 දින නිම කල යුතු වුවත් 2017 නොවැම්බර් මස කොන්ත්‍රාත්තුව අතහැර දැමීමට කටයුතු කර තිබුණි. පසුව, 2019 දෙසැම්බර් 03 දින මෙය නැවත ආරම්භ කිරීමට කටයුතු කර තිබූ අතර 2022 මාර්තු 25 දින වන විටත් භෞතික ප්‍රගතිය සියයට 45 ක ප්‍රතිශතයක් පමණක් විය.

(ඇ) ත්‍රිකුණාමල මණ්ඩපය සඳහා බහුකාර්ය ශ්‍රවණාගාරයට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රු. 674,467,920 ක කොන්ත්‍රාත් වටිනාකමට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. ගිවිසුමට අනුව 2020 නොවැම්බර් 04 දිනට කොන්ත්‍රාත්තුව අවසන් කල යුතුව පැවති නමුත් 2022 මාර්තු 25 දින වන විටත් භෞතික ප්‍රගතිය 8% ක ප්‍රතිශතයක් පමණක් වන අතර වසර එකහමාරක ප්‍රමාදයකින් පසුව පවත්නා අධික උද්ධමනය හා මිල ගණන් ඉහළ යාම මුල් කොන්ත්‍රාත් වටිනාකමට ඉතා අහිතකර ලෙස බලපානු ඇත.

2.3 වෙනත් නෛතික හා රෙගුලාසිමය අවශ්‍යතා

(අ) 2021 දෙසැම්බර් 31 දිනට මුළු ලැබිය යුතු ශේෂ වටිනාකම වන රු. 423,554,640 ක වටිනාකමින් 58 ක ප්‍රතිශතයකට සමාන රු. 245,496,675 ක වටිනාකමක් වසර 03 ක සිට වසර 39 දක්වා අයකරගෙන නොතිබුණි. මෙම මුළු ලැබිය යුතු ශේෂ වටිනාකමින් රු. 151,365,855 ක් ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් 70 දෙනෙකුගෙන් අයකර වසර 10 සිට 39 දක්වා වන ගිවිසුම් වටිනාකමක් වේ.

(ආ) සෑම දිනයකම අවසානයේ ශේෂ REPO තැන්පතුවක ආයෝජනය කිරීම තුලින් අමතර ආදායමක් ඉපයීම අනෙකුත් විශ්වවිද්‍යාලවල පොදු භාවිතයක් වුවද ත්‍රිකුණාමල මණ්ඩපයේ වගකිවයුතු නිළධාරීන් විසින් එසේ ක්‍රියා කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ සෑම දිනකම රුපියල් මිලියන 50 සිට රුපියල් මිලියන 156 දක්වා පරාසයක මුදල් ජංගම ගිණුම් මෙහි පැවති නිරීක්ෂණය කරන ලදී.

(ඇ) සමාලෝචිතවර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට අනුව පිඨ 06 විසින් ක්‍රියාකාරකම් 680 ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ අතරින් ක්‍රියාකාරකම් 329 ක් කිසිදු ආකාරයකින් ආරම්භ කර නොතිබුණි.

(ඈ) රු. 213,000,000 ක් වන මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 41% කට සමාන එකතුව රු. 86,490,795 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුල අදාල කාර්යයන් සඳහා උපයෝගී කර නොගෙන පැවති අතර රු. 33,500,000 ක වෙනත් ප්‍රාග්ධන ප්‍රතිපාදනයක් මුළුමනින්ම උපයෝගී කර නොගෙන පැවතුණි.

(ඉ) රු. 1,608,236 වන තැන්පතු බැංකු ප්‍රකාශයේ උපලබ්ධි නොවූ තැන්පතු ලෙස වසර 12 කට අධික කාලයක් පෙන්නුම් කරන අතර මෙම උපලබ්ධි නොවීමට හේතු හදුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2018 වර්ෂයේදී අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද ජාතික ශූරතා සුදුසුකම් සහතිකය මත පදනම්ව විශ්වවිද්‍යාලය විසින් අදාල අපේක්ෂකයා ශාරීරික අධ්‍යාපන උපදේශක I/II ශ්‍රේණිය තනතුරට බඳවා ගෙන තිබුණි. කෙසේ වෙතත්, නැගෙනහිර පළාත් ක්‍රීඩා සංගමය මගින් මෙම අපේක්ෂකයා එවැනි තරගාවලියකට සහභාගී නොවූ බවත් අදාල සහතිකය ව්‍යාජ එකක් බවත් තහවුරු කර තිබුණි.

(උ) විශ්වවිද්‍යාලයට අයත් ඉඩම් 15 ක අයිතිය නිරවුල් කර ගැනීම සඳහා 2016 වර්ෂයේ සිට රු. 1,215,000 ක මුදලක් උපදේශන සේවා ලෙස ගෙවීමට කටයුතු කලද 2022 ජූලි 25 දින වන විටත් මෙම ඉඩම් වල අයිතිය විධිමත්ව හඳුනාගෙන විශ්වවිද්‍යාල පොත්පත්වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2021 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා ලද රු. 3,482,240 ක රජයේ ප්‍රදාන වසර 03 සිට වසර 05 කාල සීමාවක් දක්වා උපයෝජනය නොකර පැවතුණි.

(ව) මහාචාර්යවරයකු වෙත 2020 මැයි මාසයේදී අවසන් දිගුකිරීම ලෙස පර්යේෂණයක් නිමකිරීම සඳහා රු. 7,500,000 ක මුදලක් 2015 වර්ෂයේදී අනුමත කර තිබිණි. කෙසේ වෙතත්, මෙම වෙන්කිරීමෙන් රු. 4,500,000 ක මුදලක් වියදම් කර තිබූ නමුත් 2001 ජූනි 28 දින වන විටත් මෙම පර්යේෂණය නිම කර නොතිබුණි.

(ඒ) උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් සමාලෝචිත වර්ෂය තුල කෘෂිකර්ම පීඨය හා විද්‍යා පීඨය සඳහා ලබාදුන් චකතුව රු. 23,046,063 වන පරිගණක 165ක් වොල් මවුන්ට් ස්පීකර්ස් 24 ක් සහ සවුන් කේර්සස් 04 ක් අදාල කාර්යය සඳහා උපයෝගී කර නොගෙන වසරකට අධික කාලයක් පැවැති ඇති අතර වසරක වගකීම් කාලයද ඉක්මවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

1918 අංක 19 දරණ විගණන පනතේ12 ජේදය ප්‍රකාරව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව සඳහා කලමනාකරණයේ හේතු දැක්වීම

යොමු අංකය	විගණන ජේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
1	**මූල්‍ය ප්‍රකාශන**	
1.2	**මතය සඳහා පදනම**	
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 වන ජේදයට අනුව සියළු ආදායම් අතිරික්තයට හෝ ඌනතාවයට සලකා බැලිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල කෙටි කාලීන ආයෝජන තුලින් ලද පොලී ආදායම වූ රු. 24,700,208 ක මුදල ආදායමක් ලෙස හඳුනා ගැනීමෙන් තොරව සීමිත අරමුදල් වලට බැර කිරීමට කටයුතු කර තිබුණි.	එකඟ වෙමි. සමාලෝචිත වර්ෂය තුල ලද පොලී ආදායම හා මූල්‍ය ප්‍රකාශනවල ආදායමක් ලෙස පෙන්නුම් නොකිරීමට අදාල හේතු ඇමුණුම - 01 හි පැහැදිලි කර ඇත.
(ආ)	පිරිවැය රු. 105,634,056 ක් වූ වෙනත් වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 50 ජේදය ප්‍රකාරව කිසියම් අස්තිත්වයක මෙහෙයුම් ක්‍රියාවලිය තුල අදාල වත්කමේ ස්වභාවය හෝ ක්‍රියාකාරිත්වය අනුව වර්ගීකරණය කිරීමෙන් තොරව දේපල, පිරියත හා උපකරණ යටතේ පෙන්නුම් කර තිබුණි.	එකඟ වෙමි. 1995 ඔක්තෝම්බර් 05 දිනැති හා අංක 649 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව වත්කම් වර්ගීකරණය කර සටහන් අංක 17 හි පෙන්නුම් කර ඇත. වර්ගීකරණය නොකරන ලද වත්කම් වේ නම් ඒවා චක්‍රලේඛයේ පෙන්වා දී ඇති පරිදි වෙනත් වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. කෙසේ වෙතත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නව වත්කම් කාණ්ඩ ඇතුලත් කරමින් ඉතා මෑතකදී කොමිෂන් සභා චක්‍රලේඛ අංක 09/22 නිකුත් කර ඇති අතර එය 2022 අවසන් ගිණුම්වල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ජේදය ප්‍රකාරව ස්ථාවර වත්කම්හි ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. රු. 609,026,512 ක් වූ දේපළ පිරියත හා උපකරණ මුළුමනින්ම ක්ෂය කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මෙම ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. ප්‍රමිතිය ප්‍රකාරව පහත වර්ගීකරණය කර ඇති පරිදි වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරමින් පවතී. 1. තොරතුරු තාක්ෂණික උපකරණ 2. ලී බඩු හා කාර්යාල උපකරණ 3. විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ තවද, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර ඇත.

යොමු අංකය	විගණන පේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
(ඈ)	1986 සිට 2017 කාලසීමාව තුල ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම 2018 සිට 2021 කාලසීමාව තුල ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලද රු. 1,087,500,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව ආදායම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. පාලනාධිකාරියේ අනුමැතිය මත ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඉ)	ක්‍රීඩා භාණ්ඩ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මධ්‍යස්ථානයේ හා ත්‍රිකුණාමල මණ්ඩපයේ පැවති ක්‍රීඩා භාණ්ඩ පිළිවෙලින් 10% ක ප්‍රතිශතයකින් හා 20% ක ප්‍රතිශතයකින් ක්ෂය කර තිබුණි. එබැවින් එකතුව රු. 16,159,548 වූ ක්‍රීඩා භාණ්ඩ සමුච්චිත ක්ෂය වටිනාකම සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.	එකඟ වෙමි. ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපාදනය සම්බන්ධයෙන් වන 1995 ඔක්තෝම්බර් මස 05 දින අංක 649 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය මගින් ක්‍රීඩා භාණ්ඩ ක්ෂය කිරීමට අදාල විශේෂ ප්‍රතිශතයක් සඳහන් කර නොමැති බැවින් එවැනි ක්ෂය ප්‍රතිපාදනයක් ඇතුලත් කර නොමැත. කෙසේ වෙතත්, ක්‍රීඩා උපකරණ සඳහා 25% ක ක්ෂය ප්‍රතිශතයක් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 09/22 මගින් 2022-05-10 දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දී ඇති අතර එය 2022 වර්ෂයේ අවසන් ගිණුම්වලට අදාල කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
(ඊ)	විශ්වවිද්‍යාලයේ ස්ථාන 15 ක පවතින හෙක්ටයාර 241.2 පමණක් වන ඉඩම් වටිනාකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. ඉඩම්වල අයිතිය ලබා ගැනීමට මේ වන විටත් කටයුතු කරමින් පවතී. අයිතිය පවරාගැනීමෙන් පසුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.
(උ)	පිරිවැය රු. 23,055,912 ක් වූ ජංගම නොවන වත්කම් අයිතම 275 ක් උසස් අධ්‍යාපනය ව්‍යාප්තය කිරීම වේගවත් කිරීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් 2019 සිට 2021 කාල පරිච්ඡේදය තුල විශ්වවිද්‍යාලය වෙත භාරදීමට කටයුතු කර ඇති නමුත් මෙම ව්‍යාපෘතිය මඟින් ලබා දී ඇති උපදෙස් වලට අනුව මෙම වත්කම්වල වටිනාකම ගිණුම්වල ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. වත්කම් වල විස්තර ඇතුලත් සංදේශයක් 2022-06-17 දින පැවති 126 වන මුදල් කමිටුවට ඉදිරිපත් කල අතර එහි නිර්දේශය පසුව 2002 ජුනි 25 දිනැති 324 වන පාලක සභා රැස්වීමේදී මෙම වටිනාකම් අවසන් ගිණුම්වල හා ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදි. කෙසේ වෙතත්, මෙම වත්කම් දෙපාර්තමේන්තු ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. මෙය 2022 වර්ෂයේ අවසන් ගිණුම්වල ක්ෂය සඳහා පෙර වර්ෂයේ ගැලපුම් ද සහිතව ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඌ)	2008 වර්ශයේදී රු. 3,666,316 ක පිරිවැයට ඉදිරි කර තිබූ ව්‍යාධිවේදී විද්‍යා රසායනාගාරය 2021 දෙසැම්බර් 31 දිනට රු. 2,566,312 වෙනුවට රු. 280,116 ලෙස ක්ෂය කර තිබුණි. මේ හේතුවෙන් සමුච්චිත ක්ෂය වටිනාකම රු. 2,286,196 ක වටිනාකමින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් සටහන් කර තිබුණි.	එකඟ වෙමි. මේය 2022 අවසන් ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

යොමු අංකය	විගණන පේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
(ඊ)	විශ්වවිද්‍යාලයේ තවදුරටත් සේවය කරනු ලබන කථිකාචාර්යවරු 09 දෙනකුගෙන් එකතුව රු. 34,042,950 ක් වන ගිවිසුම් කඩ කිරීමෙන් අයවිය යුතු වටිනාකම ලැබිය යුතු දෑ ලෙස ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. මෙම ගැටළුව විශ්වවිද්‍යාලයේ ගිවිසුම් ආපසු අයකර ගැනීමේ සමාලෝචන කමිටුවේ සාකච්ඡා කරමින් පවතී. තීරණය ගත් වහාම යෝග්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදු කරනු ඇත.
(උ)	සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු. 23,344,060 ක් වන පාරිතෝෂික වටිනාකම, පාරිතෝෂික වෙන් කිරීම් ගිණුමට හර කිරීම වෙනුවට පාරිතෝෂික වියදම් ගිණුමට හර කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවයේ වටිනාකම හා පාරිතෝෂික වෙන්කිරීමේ වටිනාකම මෙම ප්‍රමාණයෙන් වැඩිපුර සඳහන් කර තිබුණි.	එකඟ වෙමි. මෙය JV 2022/29 මගින් මේවන විටත් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
(ඌ)	ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් ඒකකය සඳහා රු. 224,269,514 ක පිරිවැයකට නිමකරන ලද තෙමහල් ගොඩනැගිල්ලක් 2020 අගෝස්තු 27 දින විශ්වවිද්‍යාලයට භාරදී තිබූ නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාග්ධනිත කර නොතිබුණි. මේ හේතුවෙන්, 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය සහ සමාලෝචිත වර්ෂයට ඌනතාවය පිළිවෙලින් රු. 14,913,923 සහ රු. 11,213,476 ලෙස අඩුවෙන් සටහන් කර තිබුණි.	ගෙවීම්වල පැවැති ආරවුලක් හේතුවෙන් අවසාන ගෙවීම තවදුරටත් ගෙවීමට ඇති අතර අවසන් ගෙවීම් සිදුකල වහාම වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඍ)	එකතුව රු. 4,060,132 ක් වූ බැංකු ගිණුම් තුනකට අදාල සෘජු හර කිරීම් වටිනාකම වසර 12 ක සිට මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස හඳුනා නොගෙන බැංකු සැසඳුමේහි හඳුනා නොගත් හර කිරීම් ලෙස පෙන්නුම් කර තිබුණි.	එකඟ වෙමි. 2009 වර්ෂයකට පෙර ලේඛන සොයා ගැනීමට නොහැකි බවටත් 2009 වර්ෂයට පෙර හඳුනා නොගත් අඩුපාඩු කිසිවක් පිළිබඳව සොයා බැලීමට නොහැකි බවටත් පාලක සභාව විසින් ප්‍රකාශ කර ඇත. 2015 ජූලි 17 දිනැති ලිපිය මගින් වැඩබලන මූල්‍යාධිකාරී විසින් කරන ලද ඉල්ලීමකට අනුව ප්‍රධාන ගණන්දෙන නිලධාරී වන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ඔහුගේ 2015 සැප්තැම්බර් 17 දිනැති ලිපිය මගින් පහත නිළධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කරන ලදි. අ. එස්. නේසරාජා මයා, ප්‍රධාන ගණකාධිකාරී - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව - (සභාපති) ආ. ඒ පහිදරන් මයා, වැඩ බලන ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - (සාමාජික) ඇ. එස්. කේ. ජයවර්ධන මයා, වැඩබලන මූල්‍යාධිකාරී, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - (සාමාජික) ඈ. කේ. වී. එස්. සිල්වා මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය - (සාමාජික) ඉ. ඩී. කේ. පී. ලක්මාලි මෙය, ගණකාධිකාරී, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය - (සාමාජික)

යොමු අංකය	විගණන ඡේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
		අමාත්‍යාංශය මගින් පත් කරන ලද කමිටුව රැස්නොවූ බැවින් නැවත වතාවක් අමාත්‍යාංශය විසින් 2016-12-07 දිනැති ලිපිය මගින් නව කමිටුවක් පත්කරන ලද අතර සියළු සාමාජිකයන්ට එකවර රැස්වීමේ අපහසුතාවයන් හේතුවෙන් නව කමිටුවද රැස් නොවන ලදී. එබැවින් මෙම ගැටළුව විගණන කමිටුවේ අවධානයට යොමු කරන ලදී. ප්‍රමාදය සැලකිල්ලට ගෙන තවදුරටත් අධ්‍යයනය කර ගතයුතු විසඳුම් නිර්දේශ කිරීම සඳහා අභ්‍යන්තර සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කරන ලෙස විගණන කමිටුව විසින් ලේඛකාධිකාරී තුමාට ඉල්ලීම් කරන ලදී. ලේඛකාධිකාරී තුමා විසින් පත්කරන ලද කමිටුව මගින් 2021 පෙබරවාරි 25 දින පැවති 68 වන විගණන කමිටුව සඳහා පහත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

යොමු අංකය	විගණන පේදය		කළමනාකරණයේ හේතු දැක්වීම්
2	**වෙනත් නෛතික හා රෙගුලාසි මය අවශ්‍යතා පිළිබඳ වාර්තා කිරීම**		
2.2.2	2018 අංක 19 දරන විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවය අනුව පහත කරුණු හැර විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නිකුත් කරන ලද කිසියම් අදාල ලිඛිත නීතියක්, සාමාන්‍ය හා විශේෂ මඟපෙන්වීම් පිළිබඳව අනුගත නොවී ඇත්නම් ඒ පිළිබඳව සඳහන් කිරීම.		
	නීතියට/මඟ පෙන්වීමට යොමුව	**විස්තරය**	
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 571 වන මුදල් රෙගුලාසිය	වසර 03 ක සිට වසර 06 ක කාලසීමාවකට අයත් රු. 9,091,397 ක් වූ හෝ රඳවාගැනීමේ මුදල් ශේෂ 19 ක් පියවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර තිබුණි.	විකඟ වෙමි.
(ආ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය		
(I)	ඡේදය III හි 20.8 උප වගන්තිය හා ඡේදය IV හි 4.1 උප වගන්තිය	පාලක සභාව විසින් 2020 අගෝස්තු 29 දින උද්ඝිත විද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයකුගේ ඉල්ලා අස්වීම භාර ගෙන තිබුණි. පසුව 2020 සැප්තැම්බර් 02 සිට ක්‍රියාත්මක වන පරිදි මෙම කථිකාචාර්යවරයා නැවත සේවයේ පිහිටුවා තිබුණි. කෙසේ වෙතත් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව රු. 91,310 වන මූලික වැටුප් තලයේ පිහිටුවනවා වෙනුවට රු. 119,520 ක් වන වැටුප් හා වැටුප් තලයක පිහිටුවා වේතනය රු. 1,375,407 වන මුදලක්2020 සැප්තැම්බර් 03 සිට 2021 දෙසැම්බර් 31 කාල සීමාව දක්වා ගෙවීමට කටයුතු කර තිබුණි.	වේතකඟ නොවෙමි. ආචාර්ය සී මහෙන්ද්‍රනාදන් මිය විසින් ඇය මීට පෙර දරන ලද ජේෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණියේ පිහිටුවන ලෙස හා ඇය විසින් විශ්‍රාම ගැනීමට පෙර උද්ඝිත විද්‍යා අධ්‍යනාංශයේ ජේෂ්ඨ කථිකාචාර්ය - I තනතුරට අදාලව ලද අවසන් වැටුප් පියවරෙහි පිහිටුවන ලෙස කරන ලද ඉල්ලීම මත විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ පහත විධිවිධාන වලට අනුව තීරණය කරන ලෙස 2020.08.20 දින පැවති 307 වන පාලක සභා රැස්වීම මගින් උපකුලපතිවරයාට බලය ලබා දෙන ලදි. 1. පරිච්ඡේද XVII හි 2.2 හා 2.3 වගන්තිය ‘‘.....උසස් අධ්‍යාපන ආයතනයකට ඔහු/ ඇය බඳවා ගැනීමේ පටිපාටියට බාහිරව සේවයේ නැවත පිහිටුවිය හැකි බවට නියම කර ඇත.....’’ සහ 2. පරිච්ඡේද III හි 20 වගන්තිය මගින් ඉල්ලා අස්වීමට පෙර ලැබූ සමාන වැටුප් පියවරෙහි පිහිටුවිය හැකි බවට නියම කර ඇත.
(II)	ඡේදය II හි 26.7.2 උප වගන්තිය	වෙනත් උසස් අධ්‍යාපන ආයතන හෝ වෙනත් පිළිගත් ආයතන වලින් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී පුවත්පත් දැන්වීමක් පළ කිරීම අවශ්‍ය වුවත් මෙම උප වගන්තියට පටහැනිව පීඨයේ හෝ අදාල අධ්‍යනාංශයේ අංශාධිපති හෝ පීඨාධිපතිගේ සැලකිල්ල මත පමණක් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි.	සටහන් කර ගතිමි. ව්‍යවහාරික විද්‍යා පීඨය සැලකිල්ලට ගත්කල, ඉහළ දැන්වීම් පිරිවැය, නවාතැන් පහසුකම් නොමැතිකම හා ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැතිකම හේතුවෙන් පඨයේ නිර්දේශය මත පමණක් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු කරන ලදි. පසුව 2020 අග භාගයේ දී විශ්වවිද්‍යාලය වෙබ් පිටුවේ බාහිර කථිකාචාර්ය තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවමින් දැන්වීමක් පළ කිරීමට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සනාතන සභාව විසින් තීරණය කරන ලද අතර පාස්කු ප්‍රහාරය හා වසංගත තත්වය හේතුවෙන් එයද සාර්ථක නොවුණි.

යොමු අංකය	විගණන ඡේදය		කළමනාකරණයේ හේතු දැක්වීම්
			කෙසේ වෙතත් ව්‍යවහාරික විද්‍යා පීඨය බාහිර පත්කිරීම් සඳහා දැනට පවත්නා විධිවිධාන අනුගමනය කිරීම ආරම්භ කර ඇත. දේශීය වෛද්‍ය ඒකකය (දේ.වෛ.ඒ.) ගත්කල බාහිර කථිකාචාර්ය තනතුර සඳහා කිසිදු පුද්ගලයකු අයදුම් නොකල අතර පාඨමාලා අධ්‍යයනය අවසන් කිරීමට පැවැති ඉල්ලුම සැලකිල්ලට ගෙන දේශීය වෛද්‍ය ඒකකයේ අධ්‍යයනාංශාධිපති විසින් අදාල කාර්යය මණ්ඩලයේද සහයෝගය ඇතිව බාහිර කථිකාචාර්ය ලෙස පත්කල හැකි සුදුසු පුද්ගලයන් සොයා ගැනීමට කටයුතු කරන ලදි. මෙම ක්‍රියාවලිය ද ඉතා අපහසු කර්තව්‍යයක් විය. සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය විසින් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් පුද්ගලයන්ගේ තෝරාගනු ලැබූ අයදුම්පත් පීඨ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා එම රැස්වීම් වලට යොමු කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ.
(III)	ඡේදය XX හි 3.1 උප වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය	සියලුම කාර්යය මණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සේවයට වාර්තා කිරීම සනාථ කල යුතු වුවද අදින කාර්යය මණ්ඩලය මෙම අවශ්‍යතාවය සමඟ අනුගත වී නොතිබුණි.	එකඟවෙමි. සියළුම විශ්වවිද්‍යාල වල සිදුකරන පරිදි අධ්‍යයන කාර්යය මණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍රයක සේවයට වාර්තා කිරීම සටහන් කරනු නොලබයි. කෙසේ වෙතත් සියළුම අධ්‍යයන කාර්යය මණ්ඩලය සිය පැමිණීම පැමිණීමේ ලේඛනයක සටහන් කරන අතර අධ්‍යයන සහාය කාර්යය මණ්ඩලය පැමිණීම හා පිටවයාම යන දෙකම පීඨයෙහි/ අධ්‍යයනාංශයේ පවත්වාගෙන යනු ලබන පැමිණීමේ ලේඛනයක සටහන් කරනු ලබයි.
(IV)	පරිච්ඡේද XXVI හි 2.6 උප වගන්තිය ජාතික පුස්තකාල හා ලේඛන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/ එල්ඩී/ 01 දරණ චක්‍රලේඛයේ 03 ඡේදය	පිරිවැය රු. 128,861,691 වන පුස්තකාල පොත් හා වාර සඟරා පිළිබඳ භාණ්ඩ සමීක්ෂණයක් ආරම්භයේ සිටම සිදු කර නොමැත.	එකඟ වෙමි. පුස්තකාල ස්වයංක්‍රීය දත්ත ඇතුලත් කරමින් පවතින අතර මෙම පුස්තකාල ස්වයංක්‍රීය පද්ධතිය ස්ථාපිත කල වහාම භාණ්ඩ සමීක්ෂණය සිදු කරනු ලැබේ.

යොමු අංකය	විගණන ජේදය		කළමනාකරණයේ හේතු දැක්වීම්
(V)	2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛය මගින් සංශෝධිත පරිච්ඡේද XXVI හි 03 වගන්තිය	සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය පවත්වා එහි වාර්තාව 2022 මාර්තු 17 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2022 ජූලි 18 වන දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2020 වර්ෂයට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මත හා අඹලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම 2002 ජූලි 18 වන දින විටත් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. මේ කොවිඩ් වසංගතය හේතුවෙන් සිදු වූ අතර 2021 වර්ෂය සඳහා සමීක්ෂණය නිම කිරීමටත් 2020 සමීක්ෂණ වාර්තාවේ සඳහන් අඹලි ද්‍රව්‍ය බැහැර කිරීමටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.
(ඇ)	විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ 2021 ඔක්තෝම්බර් 21 දිනැති නියෝගය හා නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්ගේ 2014 දෙසැම්බර් 09 දිනැති අංක සීවී/201/2014/ ඊයූ/එස්එල් ලිපියේ 04 ඡේදය	විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ නියෝගයට හා උසාවිය මගින් යෝජිත අදහසට අනුව 2015 ජූනි 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් ලබා දිය යුතු බවත් කථිකාචාර්යවරයකු 2011 ජූලි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජේෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණි මට්ටමට උසස් කිරීමට කටයුතු කර නොතිබූ අතර පුද්ගලික දීමනා ලෙස රු. 3,208,006 ක මුදලක් කථිකාචාර්යවරයාට වැඩිපුර ගෙවීමට කටයුතු කර තිබුණි.	එකඟ නොවෙමි. විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ අභියාචනාධිකරණයේ හා දුක්ගැනවිලි කමිටුවේ නිර්දේශයට අනුව සතානන්දන් මහතා ඔහුගේ උසස්වීම ක්‍රියාත්මක කිරීම/ සලකා බැලීම සඳහා අදාල දර්ශනශූරී උපාධිය සම්පූර්ණ කල යුතුවේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 යෙහි තනතුරු අංක 03 ට අනුව (ඔහුගේ සේවය තහවුරු කිරීම සඳහා සලකා බලන ලද) ඔහු 2011.07.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් වීමට සුදුසුකම් ලබන ලදී. 2015.12.21 දින රැස් වූ තේරීම් කමිටුව මගින් ඔහු සේවය තහවුරු කර තිබීම 2006.07.0 සිට කථිකාචාර්ය සංක්‍රාන්ති තනතුරෙහි පිහිටුවා තිබීම හා ඔහු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණියට අවශ්‍ය වසර 05 සම්පූර්ණ කර තිබීම යන කරුණු මත වී. සතානන්දන් මහතා 2011.07.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණියට උසස් කිරීමට නිර්දේශ කරන ලදී.

යොමු අංකය	විගණන පේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
2.2.3	**2018 අංක 19 දරන ජාතික විගණන පනත 12 (ඇ) වගන්තියේ අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය විසින් එහි බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**	
(අ)	2015 වර්ෂයේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන කාර්යය මණ්ඩලය කාර්යය මණ්ඩලය සඳහා නිකුත් කරන ලද ආචාර ධර්ම සහ අධ්‍යයන වගවීමට අනුව අංශ ප්‍රධාන, මහාචාර්ය පුටු, මහාචාර්ය, ජේෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය, උපදේශක - I හා උපදේශක - II යන අයගේ වර්ෂයකට සිසුන් සමඟ සම්බන්ධ වීමේ අවම පැය ගණන ඔවුන්ගේ කාලසටහනේ පිළිවලින් 180, 300, 360, 380, 450, 480 සහ 510 ලෙස පෙන්නුම් කල යුතුය. විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව 2021 වර්ෂය තුල පිඨ06 ක අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 100 දෙනෙකු අතර සිසුන් සමඟ සම්බන්ධ වීමේ පැය 38,580 බෙදා හැරිය යුතුව තිබුණි. නමුත් ඉහත සම්මතයෙන් 47 ක ප්‍රතිශතයක් නියෝජනය වන පැය 17,948 බෙදා වෙන්කර තිබුණි. තවද සිසුන්ගේ පර්යේෂණ සුපරීක්ෂණය සහ කර්මාන්තවලට ස්ථානගත කිරීම, සායනික වැඩ සහ අධ්‍යයන කටයුතු සම්බන්ධීකරණය සඳහා වැඩ බෙදාහැරීමේ සම්මතයන් සනාථ කර ගැනීම සඳහා කිසිදු වාර්තාවක් නොතිබීම හේතුවෙන් මුළු ශිෂ්‍ය ඇමතුම් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු වැඩ ප්‍රමාණය පෙන්නුම් කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් වැඩ කිරීමේ සම්මතයන් මත පදනම්ව මාර්ගෝපදේශයක් දියුණු කර ඇති බවට තහවුරු කරගත නොහැකි විය.	සටහන් කර ගතිමි. අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා නිත්‍ය වශයෙන් වෙන්කරන ලද පැය ප්‍රමාණය සහ වැඩ සම්මතයන් සමග සංසන්දනය කිරීමක් සෑම අධ්‍යනාංශයකම කාල සටහන්වල සටහන් කර ඇත. නමුත් එය ඔවුන්ගේ වැඩ ප්‍රමාණය සමග සංසන්දනය කල යුතුව ඇත. තවද, පර්යේෂණ සඳහා සහභාගි වීම හා සුපරීක්ෂණයට අදාලව වැය කරනු ලබන ශිෂ්‍යයන් සමඟ සම්බන්ධ වීමේ කාලය හා අදාල සංකල්පීය පැය ගණනද වැඩ සම්මතයන් ගණනය කිරීමේදී සැලකිල්ලට ගත යුතු වේ.
(ආ)	රටේ ජාතික ආර්ථිකය හා රැකියා වෙළඳපළට ගැලපෙන පරිදි දැනට පවත්නා විෂයයන් සහ විෂය මාලාවන් යාවත්කාලීන කලයුතු අතර නිරන්තරයෙන් වෙනස්වන රැකියා වෙළඳපලට අනුගත වීම සඳහා තාක්ෂණික විෂයයන් සහ භාෂා හැකියාවන් විෂය මාලාවට ඇතුලත් විය යුතුය. කෙසේ වෙතත්, කෘෂිකර්මය, තාක්ෂණය හා ව්‍යවහාරික විද්‍යා යන පීඨ තුනක විෂයමාලාවන් ආරම්භයේ සිටම සංශෝධනය කර නොතිබුණි.	අර්ධ වශයෙන් එකඟවෙමි. කලා හා සංස්කෘත පීඨය, විද්‍යාපීඨය හා වාණිජ හා කළමනාකරණ පීඨය ඔවුන්ගේ විෂය මාලාවන් සංශෝධනය කර ඇති අතර අනෙකුත් පීඨ විෂය මාලාවන් සංශෝධනය කරමින් පවතී.
(ඇ)	ව්‍යාපාර කළමනාකරණවේදී බාහිර උපාධි පාඨමාලාවට අදාල ශිෂ්‍ය අත්පොතට අනුව උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම කාලසීමාව අධ්‍යන වර්ෂ 03 කි. කෙසේ වෙතත් 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා වන ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය වසර පහක් තිස්සේ අවසන් කර නොතිබුණි. උපාධි පාඨමාලාව අවසන් කිරීමේ ප්‍රමාදය සිසුන්ගේ රැකියාවන් හා රැකියා කිරීමේ අවස්ථාවන් සඳහා ඉතා අහිතකර ලෙස බලපෑ හැකිය.	අර්ධ වශයෙන් එකඟ වෙමි. <u>ශාස්ත්‍රවේදී උපාධිය සඳහා</u> 2016/17 කණ්ඩායම සඳහා අධ්‍යයන වාරය‍ෙ කොවිඩ් -19 වසංගත තත්වය හේතුවෙන් ප්‍රමාද විය. දේශන සහ විභාග කටයුතු තරමක් දුරට ප්‍රමාද විය. දැනට තෙවන වසර දෙවන සමාසිකයේ විභාග අවසන් කර ඇති අතර උපාධි ප්‍රදානය කිරීම සඳහා බලාපොරොත්තුවෙන් පසුවේ.

යොමු අංකය	විගණන ඡේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
(ඈ)	බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා මධ්‍යස්ථානය හා කලා හා සංස්කෘත පීඨය මඟින් වසර 10 ක් තිස්සේ ශාස්ත්‍රවේදී කලා උපාධිය නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මඩකලපුව දිස්ත්‍රික්කයට අයත් කලාපයේ උනන්දුවක් දක්වන සිසුන්ට පසුගිය වසර 10 ක් තිස්සේ කලාපය තුලම ශාස්ත්‍රවේදී කලා උපාධියක් හැදෑරීමට තිබූ අවස්ථාව අහිමි වූ අතර ඒ වෙනුවට එම සිසුන්ට වෙනත් දිස්ත්‍රික්ක හෝ පළාත්වල පිහිටි විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා හැදෑරීමට සිදුව ඇත. තවද, දර්ශනශූරී දර්ශනපති ඩිප්ලෝමා සහ සහතික ප්‍රත්‍ර යනාදි පාඨමාලා 11 ක් 2018 වර්ෂයේ සිට පැවැත්වීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි.	සටහන් කර ගතිමි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2021 මඟින් 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි බාහිර පාඨමාලා තාවකාලිකව නතර කිරීමට කටයුතු කරන ලදි. මේ අතර පීඨය විසින් නව යෝජනාවලියක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කල අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කලා හා මානව ශ්‍රාස්ත්‍ර ස්ථාවර කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි. කෙසේ වෙතත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2021.01.15 දිනැති අංක 01/2021 දරණ චක්‍රලේඛය ප්‍රකාරව යෝජනාවලිය ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස පීඨයට දැනුම් දෙන ලදි. දැනට පීඨය විසින් අභ්‍යන්තර උපාධි පාඨමාලාවන් වලට අදාල විෂය මාලාවන් සංශෝධනය කරමින් පවතින අතර එය බාහිර උපාධි පාඨමාලාවන් සඳහාද අදාල කරගනු ලැබේ. දර්ශනශූරී උපාධි පාඨමාලාවන්, බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා මධ්‍යස්ථානයේ විෂය පථයට ඇතුලත් නොවේ. බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා මධ්‍යස්ථානය මඟින් පහත පාඨමාලාවන් සඳහා අයදුම්පත් කැඳවුවද ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොතිබීම සහ මූල්‍යමය වශයෙන් ශක්‍යතාවක් නොතිබීම හේතුවෙන් අදාල ක්‍රියාවලිය පවත්වාගෙන යාමට නොහැකිවිය. 1. කලා හා සංස්කෘත පීඨය මඟින් පිරිනමනු ලබන මූලික ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා පුහුණු වැඩසටහන 2.විද්‍යා පීඨය මඟින් පිරිනමනු ලබන මයික්‍රොසොෆ්ට් වර්ඩ් භාවිතයෙන් ලියකියවිලි සකස් කිරීමේ පුහුණු වැඩසටහන 3.විද්‍යා පීඨය මඟින් පිරිනමන ලබන බහුමාධ්‍යය වෙබ් අඩවි නිර්මාණය කිරීමේ පුහුණු වැඩසටහන කෙසේ වෙතත්, බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා මධ්‍යස්ථානය මඟින් දැනට පහත පාඨමාලාවන් පවත්වාගෙන යනු ලැබේ. <u>උපාධි පාඨමාලාවන්</u> 1. ව්‍යාපාර කළමනාකරණවේදි 2. හෙද විද්‍යාවේදී 3. කළමනාකරණ විද්‍යාවේදී (ත්‍රිකුණාමල මණ්ඩපය) <u>ඩිප්ලෝමා වැඩසටහන්</u> 1. කෘෂිකර්ම ඩිප්ලෝමාව 2. රසායනාගාර තාක්ෂණ ඩිප්ලෝමාව 3. මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (ත්‍රිකුණාමල මණ්ඩපය) බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා ඒකකය මඟින් ඉදිරියේදී පහත ව්‍යාප්ති පාඨමාලා පැවැත්වීමට යෝජනා කර ඇත. 1. නීති ඩිප්ලෝමාව 2. මනෝ විද්‍යා ඩිප්ලෝමාව 3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමාව

යොමු අංකය	විගණන ඡේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
2.2.4	**2018 අංක 19 දරන විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පහත සඳහන් නිරීක්ෂණ විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**	
(අ)	ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට රු. 6,247,846 ක මුදලක් 2013 සිට 2015 දක්වා ගෙවීමට කටයුතු කර තිබුණද එය ක්‍රමානුකූලව යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට සමහර ගනුදෙනු ඇතුලත් කර නොතිබුණි. තවද, ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට හා අඩුපාඩු නිවැරදි කිරීමට ක්‍රියාමාර්ගගෙන නොතිබුණු අතර සැලකිය යුතු වෙනස්කම් පවත්නා භෞතික වත්කම් වටිනාකමෙහි, මූල්‍ය ප්‍රකාශනවලට අනුව වත්කම්වල වටිනාකම් සහ ස්ථාවර වත්කම් ලේඛනයට අනුව වත්කම්වල වටිනාකම් නිරීක්ෂණය කරන ලදි. එබැවින්, මෙවැනි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම වෙනුවෙන් දරන ලද වියදම ඵල රහිත බවට පත්ව තිබුණි.	එකඟ වෙමි. පද්ධතියට ඇතුලත් කරන ලද වත්කම් හා භෞතිකව පවත්නා ඉන්වෙන්ට්‍රි අයිතම සංසන්දනය කිරීම මේවන විටත් කරමින් පවතී. මේ වන විට අප විසින් දෙපාර්තමේන්තු තුනක යාවත්කාලීන කිරීම් නිම කර ඇත. මූල්‍ය ශාඛාවේ සමීක්ෂණ කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී.
(ආ)	විධිමත් ශක්‍යතා අධ්‍යයනයකින් හා ප්‍රමාණවත් ප්‍රතිපාදන වලින් තොරව ත්‍රිකුණාමල මණ්ඩපය සඳහා අභ්‍යන්තර මාර්ගයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ පළමු අදියර 2017 මැයි 02 දින රු. 55,775,000 වටිනාකමට මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රදානය කර තිබුණි. ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 01 දින නිම කල යුතු වුවත් 2017 නොවැම්බර් මස කොන්ත්‍රාත්තුව අතහැර දැමීමට කටයුතු කර තිබුණි. පසුව, 2019 දෙසැම්බර් 03 දින මෙය නැවත ආරම්භ කිරීමට කටයුතු කර තිබූ අතර 2022 මාර්තු 25 දින වන විටත් භෞතික ප්‍රගතිය සියයට 45 ක ප්‍රතිශතයක් පමණක් විය.	සටහන් කර ගතිමි. අරමුදල් සීමාකම හා වසංගත තත්වය හේතුවෙන් ඉදිකිරීම් අත්හැර දැමීමට හා ප්‍රමාද කිරීමට සිදුවිය. කරුණාකර ඇමණුම 02 බලන්න.
(ඇ)	ත්‍රිකුණාමල මණ්ඩපය සඳහා බහුකාර්ය ශ්‍රවණාගාරයට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රු. 674,467,920 ක කොන්ත්‍රාත් වටිනාකමට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. ගිවිසුමට අනුව 2020 නොවැම්බර් 04 දිනට කොන්ත්‍රාත්තුව අවසන් කල යුතුව පැවති නමුත් 2022 මාර්තු 25 දින වන විටත් භෞතික ප්‍රගතිය 8% ක ප්‍රතිශතයක් පමණක් වන අතර වසර එකහමාරක ප්‍රමාදයකින් පසුව පවත්නා අධික උද්ධමනය හා මිල ගණන් ඉහළ යාම මුල් කොන්ත්‍රාත් වටිනාකමට ඉතා අහිතකර ලෙස බලපානු ඇත.	සටහන් කර ගතිමි. අරමුදල් සීමාකම හා වසංගත තත්වය හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය. කරුණාකර ඇමුණුම 03 බලන්න.

යොමු අංකය	විගණන ජේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
2.3	**වෙනත් ගැටළු**	
(අ)	2021 දෙසැම්බර් 31 දිනට මුළු ලැබිය යුතු ශේෂ වටිනාකම වන රු. 423,554,640 ක වටිනාකමින් 58 ක ප්‍රතිශතයකට සමාන රු. 245,496,675 ක වටිනාකමක් වසර 03 ක සිට වසර 39 දක්වා අයකරගෙන නොතිබුණි. මෙම මුළු ලැබිය යුතු ශේෂ වටිනාකමින් රු. 151,365,855 ක් ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් 70 දෙනෙකුගෙන් අයකර වසර 10 සිට 39 දක්වා වන ගිවිසුම් වටිනාකමක් වේ.	එකඟවෙමි. අත්තිකාරම් හා ණය ශේෂයන් විවිධ තෙවන පාර්ශ්වයන්ගෙන් හා අභ්‍යන්තර කාර්යය මණ්ඩලයෙන් (සේවයේ සිටින, සේවයෙන් ඉවත්වූ, අභාවයට පත් වූ සහ ගිවිසුම් කඩ කල) ලැබිය යුතු දෑ ලෙස පෙන්නුම් කර ඇත. විශාල වටිනාකමක් 1998 සිට සමුච්චිත වී ඇති අතර මේ සඳහා කිසිදු වාර්තාවක් නොමැත. කෙසේ වෙතත්, පවත්නා තොරතුරු මත පදනම්ව දැනට පවත්නා නීති/රෙගුලාසි වලට අනුව නොපියවූ අත්තිකාරම් අයකරගැනීමට/ කපාහැරීමට විශ්වවිද්‍යාලය මේ වන විටත් කටයුතු කරමින් පවතී. පහත සඳහන් පරිදි දැනටමත් සේවයේ යෙදී සිටින කාර්යය මණ්ඩලයෙන් ඉතා දීර්ඝ කාලයක් තිස්සේ අයවිය යුතු ශේෂයන් අයකර ගැනීම සඳහා 2020 දෙසැම්බර් 19 දින පැවති 311 වන පාලක සභාවේ තීරණය පරිදි විශ්වවිද්‍යාලය විසින් මේ වන විටත් ක්‍රියාමාර්ග ගෙන ඇත. ''වඩා හොඳ මූල්‍ය වාර්තාවක් සහ විශ්වවිද්‍යාලයේ කීර්තිනාමය පවත්වාගෙන යෑම සඳහා යෝග්‍ය වාරික වලින් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා අදාල කාර්යය මණ්ඩලයේ කැමැත්ත ලබාගැනීමෙන් පසුව මෙම නොපියවූ ශේෂයන් මෙම කාර්යය මණ්ඩලයේ වැටුපෙන් අයකර ගැනීමට පාලක සභාව තීරණය කරන ලදි. නිරවුල් කිරීම සනාථ කිරීමට අදාල කිසියම් ලියකියවිල්ලක් තිබේනම් එම කාර්යය මණ්ඩලයට අදාල ලියකියවිලි ඉදිරිපත් කර ඔවුන්ගේ නම් අදාල වාර්තා වලින් ඉවත් කර ගැනීමට හැකි බවද දැනුම් දෙන ලදි.'' පරිපාලන අවශ්‍යතාවය මත 2010 සිට පෙර අයකරගත යුතු අත්තිකාරම් හා 2010 ට පසු අයකරගත යුතු අත්තිකාරම් ලෙස අත්තිකාරම් ප්‍රධාන වර්ග දෙකකට බෙදා වෙන් කර ඇත. 2010 ට පසු අයවිය යුතු අත්තිකාරම් වලට අදාල තොරතුරු සොයාගත හැකි බැවින් ඒවා අයකර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති නමුත් 2010 ට පෙර තොරතුරු සොයාගැනීමට නොහැක. එබැවින්, බාහිර පාර්ශවවලින් අයවිය යුතු ශේෂයන් පොත්වලින් කපා හැරීමට අදාල අධිකාරීන්වල අනුමැතිය මත කටයුතු කරනු ලැබේ.
(ආ)	සෑම දිනයකම අවසානයේ ශේෂ REPO තැන්පතුවක ආයෝජනය කිරීම තුලින් අමතර ආදායමක් ඉපයීම අනෙකුත් විශ්වවිද්‍යාලවල පොදු භාවිතයක් වුවද ත්‍රිකුණාමල මණ්ඩපයේ වගකිවයුතු නිළධාරීන් විසින් එසේ ක්‍රියා කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ සෑම දිනකම රුපියල් මිලියන 50 සිට රුපියල් මිලියන 156 දක්වා පරාසයක මුදල් ජංගම ගිණුම් මෙහි පැවති නිරීක්ෂණය කරන ලදි.	එකඟ වෙමි. අතිරේක මුදල් ආයෝජනය කිරීම සඳහා පාලක සභාව විසින් අනුමැතිය ලබාදී ඇති අතර ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

යොමු අංකය	විගණන ඡේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
(ඇ)	සමාලෝචිතවර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට අනුව පීඨ 06 විසින් ක්‍රියාකාරකම් 680 ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ අතරින් ක්‍රියාකාරකම් 329 ක් කිසිදු ආකාරයකින් ආරම්භ කර නොතිබුණි.	සටහන් කර ගනිමි. උනන්දුවක් දක්වන පාර්ශවයන්හි අවශ්‍යතාවය මත (SPSU) මගින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරනු ලබන අතර එකිනෙක පීඨවල හා ඒකකවල ක්‍රියාකාරී සැලැස්මේ අර්ධ වාර්ෂික සහ වාර්ෂික ප්‍රගතිය නියාමනය කරනු ලැබේ. 2021 වර්ෂය සඳහාද අර්ධ වාර්ෂික සහ වාර්ෂික ප්‍රගතිය ඉල්ලා සිටි අතර ඉදිරිපත් කරන ලද වාර්තාවලට අනුව අනාවරණය වූයේ කොවිඩ් - 19 වසංගත තත්වය හා පළාත් අතර සංචරණ සීමා හේතුවෙන් බොහෝමයක් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර නොමැති බවයි. එසේම, රට අගුළු දා තිබීම හේතුවෙන් මාස කිහිපයක් සිසුන් භෞතිකව නොසිටි අතර මේ හේතුවෙන් බොහොමයක් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට හා අවසන් කිරීමට නොහැකි විය. තවද, සම්පූර්ණ නොකරන ලද ක්‍රියාකාරකම් 2022 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කල හැකිය.
(ඈ)	රු. 213,000,000 ක් වන මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 41% කට සමාන එකතුව රු. 86,490,795 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුල අදාල කාර්යයන් සඳහා උපයෝගී කර නොගෙන පැවති අතර රු. 33,500,000 ක වෙනත් ප්‍රාග්ධන ප්‍රතිපාදනයක් මුළුමනින්ම උපයෝගී කර නොගෙන පැවතුණි.	පැවති වසංගත තත්වය හා කලබලකාරී ආර්ථික තත්වය හේතුවෙන් ඇණවුම් කරන ලද භාණ්ඩ ලැබීමේ ප්‍රමාදය මෙයට හේතුවිය. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයට පමණක් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 60 ක බැඳීමක් පැවතුණි.
(ඉ)	රු. 1,608,236 වන තැන්පතු බැංකු ප්‍රකාශයේ උපලබ්ධි නොවූ තැන්පතු ලෙස වසර 12 කට අධික කාලයක් පෙන්නුම් කරන අතර මෙම උපලබ්ධි නොවීමට හේතු හදුනාගැනීමට කටයුතු කර නොතිබුණි.	විකඟ වෙමි. 2009 වර්ෂයට පෙර කාලය සනාථ කිරීමේ ලියකියවිලි නොමැති බවට පාලක සභාව විසින් ප්‍රකාශ කර ඇත. පොත්වලින් කපාහැරීම සඳහා මේවන විටත් කටයුතු කර ඇත. 2015 ජූලි 17 දිනැති ලිපිය මගින් වැඩබලන මූල්‍යාධිකාරී විසින් කරන ලද ඉල්ලීමකට අනුව ප්‍රධාන ගණන්දෙන නිලධාරී වන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ඔහුගේ 2015 සැප්තැම්බර් 17 දිනැති ලිපිය මගින් පහත නිළධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කරන ලදි. අ. එස්. නේසරාජා, ප්‍රධාන ගණකාධිකාරී - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඩකලපුව - සභාපති ආ. ඒ පහිදරන් මයා, වැඩ බලන ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - සාමාජික ඇ. එස්. කේ. ජයවර්ධන මයා, වැඩබලන මූල්‍යාධිකාරී, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - සාමාජික ඈ. කේ. වී. එස්. සිල්වා මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය - සාමාජික ඉ. ඩී. කේ. ජී. ලක්මාලි මෙය, ගණකාධිකාරී, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය - සාමාජික

යොමු අංකය	විගණන පේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
		අමාත්‍යාංශය මගින් පත් කරන ලද කමිටුව රැස්නොවූ බැවින් නැවත වතාවක් අමාත්‍යාංශය විසින් 2016-12-07 දිනැති ලිපිය මගින් නව කමිටුවක් පත්කරන ලද අතර සියළු සාමාජිකයන්ට එකවර රැස්වීමේ අපහසුතාවයන් හේතුවෙන් නව කමිටුවද රැස් නොවන ලදි. එබැවින් මෙම ගැටළුව විගණන කමිටුවේ අවධානයට යොමු කරන ලදි. ප්‍රමාදය සැලකිල්ලට ගෙන තවදුරටත් අධ්‍යයනය කර ගතයුතු විසඳුම් නිර්දේශ කිරීම සඳහා අභ්‍යන්තර සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කරන ලෙස විගණන කමිටුව විසින් ලේඛකාධිකාරී තුමාට ඉල්ලීම් කරන ලදි. ලේඛකාධිකාරී තුමා විසින් පත්කරන ලද කමිටුව මගින් 2021 පෙබරවාරි 25 දින පැවති 68 වන විගණන කමිටුව සඳහා පහත නිර්දේශ ඉදිරිපත් කරන ලදි. 68 වන විගණන කමිටුව විසින් මෙම විසඳුම් නිර්දේශ කර 2021-03-27 දින පැවති 314 වන පාලක සභාවට යොමු කරන ලද අතර පාලක සභාව විසින් විගණන කමිටුවේ නිර්දේශයන් අනුමත කරන ලදි. බැංකු ගිණුම තුනක් උපකුලපතිවරයාගේ අනුමත සීමාව තල මේවන විටත් කපා හැරීමට කටයුතු කර ඇත.
(ඊ)	2018 වර්ෂයේදී අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද ජාතික ශූරතා සුදුසුකම් සහතිකය මත පදනම්ව විශ්වවිද්‍යාලය විසින් අදාල අපේක්ෂකයා ශාරීරික අධ්‍යාපන උපදේශක I/II ශ්‍රේණිය තනතුරට බඳවා ගෙන තිබුණි. කෙසේ වෙතත්, නැගෙනහිර පළාත් ක්‍රීඩා සංගමය මගින් මෙම අපේක්ෂකයා එවැනි තරගාවලියකට සහභාගී නොවූ බවත් අදාල සහතිකය ව්‍යාජ එකක් බවත් තහවුරු කර තිබුණි.	එකඟ වෙමි. එස් ශ්‍රීදරන් මහතා විසින් XXXIV වන ජාතික ක්‍රීඩා තරගාවලිය - 2010 (ක්‍රිකට්) සහභාගිවීමට අදාළව ඉදිරිපත් කරන ලද සහතිකය සත්‍ය බවට සහතික කිරීම සඳහා වන ඉල්ලීමක් 2022.03.28 දින ලේකම්, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන ලේකම් වෙනුවට), විසින් ඔහුගේ 2022.05.18 දිනැති අංක එම්ඕවයි/ ඩිඊවී/ එස්පී/ එස්වල්සී/08/04 ලිපිය මගින් මෙම සහතිකය සත්‍ය බවට සනාථ කිරීමේ වාර්තාව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාල ආයතන අංශයට ඉදිරිපත් කිරීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වෙත යොමු කර තිබුණි. සත්‍ය බවට සනාථ කිරීමේ සහතිකය බලාපොරොත්තුවෙන් පසුවේ.
(උ)	විශ්වවිද්‍යාලයට අයත් ඉඩම් 15 ක අයිතිය නිරවුල් කර ගැනීම සඳහා 2016 වර්ෂයේ සිට රු. 1,215,000 ක මුදලක් උපදේශන සේවා ලෙස ගෙවීමට කටයුතු කලද 2022 ජූලි 25 දින වන විටත් මෙම ඉඩම් වල අයිතිය විධිමත්ව හඳුනාගෙන විශ්වවිද්‍යාල පොත්පත්වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ නොවෙමි. ඉඩම්වල අයිතිය ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලය මට්ටමින් ක්‍රියාමාර්ග ගැනීම මේවන විටත් ආරම්භ කර ඇති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පළාත් ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් හා ඉඩම් අමාත්‍යාංශය යනාදි අදාල අධිකාරීන්වල අනුමැතිය ලබාගැනීම බලාපොරොත්තුවෙන් පසුවේ.
(ඌ)	2021 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා ලද රු. 3,482,240 ක රජයේ ප්‍රදාන වසර 03 සිට වසර 05 කාල සීමාවක් දක්වා උපයෝජනය නොකර පැවතුණි.	සටහන් කර ගතිමි. විශේෂයෙන් කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් රටෙහි පැවති තත්වය නිසා කාර්යය මණ්ඩලයෙන් ඉතා අඩු අයදුම්පත්‍ර සංඛ්‍යාවක් ලැබුණි.

යොමු අංකය	විගණන ඡේදය	කළමනාකරණයේ හේතු දැක්වීම්
(ඇ)	මහාචාර්යවරයකු වෙත 2020 මැයි මාසයේදී අවසන් දිගුකිරීම ලෙස පර්යේෂණයක් නිමකිරීම සඳහා රු. 7,500,000 ක මුදලක් 2015 වර්ෂයේදී අනුමත කර තිබිණි. කෙසේ වෙතත්, මෙම වෙන්කිරීමෙන් රු. 4,500,000 ක මුදලක් වියදම් කර තිබූ නමුත් 2001 ජූනි 28 දින වන විටත් මෙම පර්යේෂණය නිම කර නොතිබුණි.	සටහන් කර ගතිමි. පර්යේෂක විසින් අවසන් පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කරන ලද අතර එය විචාරකයන් වෙත යොමු කරන ලදි. විචාරකයන්ගේ අදහස් දැක්වීම් පර්යේෂක වෙත යොමු කරන ලද අතර විචාරකයන්ගේ අදහසද ඇතුලත් කරමින් සකස් කරනු ලබන අවසන් වාර්තාව අපේක්ෂාවෙන් පසුවේ. (සටහන 2 : එමෙන්ම පර්යේෂණ සභාවේ සාමාජිකයකුගේ යෝජනාවකට අනුව සතියක් ඇතුලත ප්‍රමාදය සඳහා හේතු ඉදිරිපත් කරන ලෙස පර්යේෂකගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
(ඈ)	උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මඟින් සමාලෝචිත වර්ෂය තුල කෘෂිකර්ම පීඨය හා විද්‍යා පීඨය සඳහා ලබාදුන් චිකතුව රු. 23,046,063 වන පරිගණක 165ක් වොල් මවුන්ට් ස්පීකර්ස් 24 ක් සහ සවුන් කේර්සස් 04 ක් අද්‍යාල කාර්යය සඳහා උපයෝගී කර නොගෙන වසරකට අධික කාලයක් පැවැති ඇති අතර වසරක වගකීම් කාලයද ඉක්මවා තිබුණි.	චකඟවෙමි. සිසුන් සඳහා ස්මාර්ට් පන්ති කාමරයක් සකස් කිරීම සඳහා මෙම අයිතම මිලදී ගන්නා ලදි. කෙසේ වෙතත් වසංගත තත්වයේ ප්‍රතිඵලයක් ලෙස ද්‍රව්‍ය හා ශ්‍රමය නොමැතිකම හේතුවෙන් ගොඩනැගිලි ඇතුලත වැඩ අපේක්ෂිත කාල සීමාව තුල නිම කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, ගොඩනැගිලි ඇතුලත වැඩ නිමකිරීම හා පරිගණක හා ස්ථාපිත කිරීම මේ වන විටත් සිදු කරමින් පවත.

මහාචාර්ය වී කනගසිංහම්
උපකුලපති
නැගෙනහිර විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාව

ඇමුණුම 01

වර්ෂය තුල ලද පොළී ආදායම	එකතුව (රු.)	මූල්‍ය ප්‍රකිශන වල පෙන්නුම් නොකිරීමට හේතුව
ස්වාමි විපුලානන්ද අනුස්මරණ දේශන අරමුදල ආයෝජනය තුළින් ලද පොළිය	193.05	මෙම ආදායම විපුලානන්ද අනුස්මරණ උත්සව සඳහා යොදාගනු ලබන බැවින් මෙය ආදායමක් ලෙස ගත නොහැක.
පරිත්‍යාග අරමුදල් ආයෝජනය තුළින් අද පොළිය	500,581.76	පරිත්‍යාග අරමුදල සඳහා දායක වූවන් සමඟ ඇති කරගත් ගිවිසුමට අනුව මෙම මුදල් සිසුන් සඳහා ප්‍රදානය කිරීමට පසෙකින් තබන බැවින් එය ආදායම් ලෙස ගත නොහැක.
කෙටි කාලීන ආයෝජන තුළින් ලද පොළිය	3,259,643.83	පාලක සභාවේ අනුමැතිය මත ක්‍රියාමාර්ග ගනු ලැබේ.
ගිවිසුම් බැඳීම් (ආපසු අයකර ගත්) අරමුදල් ආයෝජන ගිණුම මගින් ලද පොළිය	818,316.53	කොමිෂන් සභා චක්‍රලේඛ 737 ප්‍රකාරව ආදායම් ලෙස ගත නොහැකි අතර මෙම අරමුදල උපයෝගී කරගත හැක්කේ; I. විශ්වවිද්‍යාල සඳහා කෙටිකාලීන පුහුණු පාඨමාලා/ වැඩමුළු පැවැත්වීම (අදාල නිලධාරීන් ද ඇතුළත්ව) II. ආචාර්යවරුන්ට සමුළුවලදී පර්යේෂණ පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා III. පර්යේෂණ ප්‍රකාශන සඳහා අනුග්‍රහය දැක්වීමට IV. දේශීයව සමුළු/ සම්මන්ත්‍රණ/ වැඩමුළු සංවිධානය කිරීම සඳහා අනුග්‍රහය දැක්වීමට
හදිසි තැන්පතු	20,121,472.64	2020-11-28 දින පැවති 310 වන පාලක සභාවේ අනුමැතිය මත එය සංවර්ධන අරමුදලට මාරු කිරීමට කටයුතු කරන ලදි.
එකතුව	**24,700,207.81**	

ඇමුණුම 02

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපයේ අභ්‍යන්තර මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සැලසුම් කිරීමේ හා ඉදිකිරීමේ පදනමට (මැනුම් හා ගෙවීම්) අනුමත ගාස්තු යටතේ (HSR) රුපියල් මිලියන 145 කට (මුළු දිග කි.මී 03) "මගනැගුම සමාගමට" 2016-11-08 දින පැවති කැබිනට් මණ්ඩල රැස්වීමේදී ප්‍රදානය කරන ලදි. තවද, 2017/2019 මධ්‍යකාලීන අයවැය රාමුව තුල ප්‍රාග්ධන වියදම් සඳහා කරනු ලබන වෙන්කිරීම් තුග මෙම අරමුණට අවශ්‍ය අරමුදල් කළමනාකරණය කර ගැනීමට යටත් විය යුතු බවට දක්වා තිබුණි. එසේම, කැබිනට් සංදේශය සඳහන් කර තිබුණේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රියාමාර්ග ගත යුතු බවයි.

ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන ලදි. ආරම්භයේදී, මෙම කාර්යය අදියර දෙකකට බෙදා වෙන් කරන ලද අතර අදියර සඳහා ඇස්තමේන්තුගත පිරිවැය පිළිවෙලින් රුපියල් මිලියන 55.775 ක් හා රුපියල් මිලියන 89.224 විය. ඊට පසු 2017 පෙබරවාරි 07 දින නැගෙනහිර පළාතේ පළාත් අධ්‍යක්ෂක විසින් මුළු කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 55.775 ක් යටතේ අදියර - 01 (කි.මී1.5) සඳහා "මග නැගුම මාර්ග ඉදිකිරීමේ උපකරණ (පෞද්ගලික) සමාගම" වෙත වැඩ විධානයක් නිකුත් කරන ලදි. ත්‍රිකුණාමල මණ්ඩප භූමියේ සත්‍ය වැඩකටයුතු 2017 මැයි 02 වන දින ආරම්භ කිරීමට කටයුතු කරන ලදි. මාර්ග සංවර්ධන අධිකාරියේ සෘජු අධීක්ෂණය යටතේ කිසිදු ප්‍රමාදයකින් තොරව මාස 05 ක කාලයක් දක්වා පහසුවෙන් ක්‍රියාත්මක කරන ලදි. නිම කරන ලද වැඩ සඳහා (අදියර - 01 හි භෞතික ප්‍රගතිය 45% ක් විය) ගෙවීම නොකිරීම හේතුවෙන් 2017 නොවැම්බර් මස කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති අත්හැර දමන ලදි.

නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් අධ්‍යක්ෂකගේ වැඩ විධානයේ අවශ්‍යය අරමුදල් ඇති බවට සඳහන් කර තිබීම හේතුවෙන් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය විසින් 2018 අයවැය ඇස්තමේන්තුවල අවශ්‍ය අරමුදල් ඇතුලත් කිරීමට කටයුතු නොකරන ලදි. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන අවස්ථාවේදී මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය යන දෙකම එකම අමාත්‍යාංශයක් යටතේ පාලනය වීම හේතුවෙන් මෙයට අදාල අරමුදල් සෘජුවම මාර්ග සංවර්ධන අධිකාරියට වෙන්කර ඇති බවට උපකල්පනය කරන ලදි. කෙසේ වෙතත්, උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) විසින් ඔහුගේ 2018-09-20 දිනැති ලිපිය මගින් ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමට හා නිම කිරීමට අධ්‍යක්ෂ ජෙනරාල්, මාර්ග සංවර්ධන අධිකාරියට රු. 55,770,000 ගෙවන ලෙස ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපයට උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව ව්‍යාපෘතිය නියමාකාරයෙන් පවත්වාගෙන යාමට හා 2019 වර්ෂය සඳහා අනුමත අයවැය ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 25 ක ප්‍රතිපාදන මාරු කිරීම සඳහා වන ඉල්ලීම 2019-05-29 දින පැවති මුදල් කමිටුව මගින් නිර්දේශ නොකරන ලදි. ඒ වෙනුවට, මුදල් කමිටුවේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අමතර අරමුදල් ලබාගැනීම හා සම්පාදන ක්‍රියාවලියට අදාල වගකීම් නිශ්චය කර ගැනීමට සාකච්ඡා කරන ලෙස ඉල්ලීමක් කරන ලදි. මෙයට අදාලව, අරමුදල් වෙන් කිරීමේ ගැටලුව නිරවුල් කර ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරියෙකු සමග සාකච්ඡාවක් සංවිධානය කරන ලෙස 2019-06-20 දින ත්‍රිකුණාමල මණ්ඩපයේ මන්ඩාධිපති විසින් යොමු කරන ලදි. අපගේ ලිපියට අනුව 2019-07-10 දින රැස්වීමක් සංවිධානය කරන ලද අතර එහිදී, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය හා මාර්ග සංවර්ධන අධිකාරිය අතර විධිමත් ගිවිසුමක් අත්සන් කිරීමටතීරණය කරන ලද අතර මෙම රැස්වීම පැවැත්වීමෙන් පසුව අරමුදල් පිළිබඳ ගැටලුවද නිරාකරණය විය.

ඒ අනුව, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාව 2019-08-31 දිව පැවැති 301 වන රැස්වීමේදී මෙය අනුමත කරන ලදි. පාලක සභාවේ තීරණයට අනුව 2019-12-03 දින ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය හා මාර්ග සංවර්ධන අධිකාරිය අතර විධිමත් ගිවිසුමක් අත්සන් කරන ලදි. ත්‍රිකුණාමල මණ්ඩපය විසින් එහි 2020-02-24 දිනැති ලිපිය මගින් අරමුදල් නිදහස් කිරීම සඳහා සූදානම් බවත් නැවත වැඩ කටයුතු ආරම්භ කරන ලෙසත් මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දෙන ලදි. ඊට පසු, 2020-06-25 දින මාර්ග සංවර්ධන අධිකාරියේ නියෝජිතයන් සමඟ රැස්වීමක් පැවැත්වූ අතර එහිදී 2020-07-15 දින ඉතිරි වැඩ නැවත ආරම්භ කිරීමට එකඟ විය. කෙසේ වෙතත්, ඊට පසු එම කාර්යය නැවත ආරම්භ නොකරන ලද අතර එම කාර්යය නැවත ආරම්භ කරන ලෙස දන්වා 2020-09-21 සහ 2021-01-13 දින ත්‍රිකුණාමල මණ්ඩපයේ මන්ඩාධිපති විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත ලිපි යොමු කිරීමට කටයුතු කරන ලදි.

1. අරමුදල් වෙන් කිරීම පිළිබඳ ගැටලුව 2019-12-13 නිරාකරණය විය.
2. වැඩ නැවත ආරම්භ කිරීම සඳහා ඉල්ලීම් ලිප අඛණ්ඩව මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරන ලදි.

තවද, මාර්ග සංවර්ධන අධිකාරිය රාජ්‍ය ආයතනයක් බැවින් කාර්යයසාධන බැඳුම්කරයක් ලබා නොදුන් බැවින් අදාල කාර්යය නිම කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට බලපෑම් කිරීමේ හැකියාවක් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමලය මණ්ඩපයට නොමැත, කෙසේ වෙතත්, අරමුදල් ගැටලුව නිරාකරණය කිරීමෙන් පසුවද මෙම කාර්යය නැවත ආරම්භ කිරීම ප්‍රමාද වීම සඳහා 2020 මාර්තු මුල භාගයේ සිට ආරම්භව 2021 මැද භාගය දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වූ කෝවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් රට පුරා ක්‍රියාත්මක වූ අඟුලු දැමීම් හේතු වූවා විය හැකිය.

ඇමුණුම 03

මූලික වැඩකටයුතු 2018 අගෝස්තු 09 වන දින ආරම්භ කරන ලද අතර කොන්ත්‍රාත් වටිනාකමින් 20% ක අත්තිකාරම් මුදලක් ලැබීමට කොන්ත්‍රාත්කරු සුදුසුකම් ලබන බැවින් කොන්ත්‍රාත්කරු, කොන්ත්‍රාත් වටිනාකමින් 20% වන රුපියල් මිලියන 155 ක් සඳහා වලංගු අත්තිකාරම් ඇපකරයක් ඉදිරිපත්කර අත්තිකාරම් මුදල් ගෙවන ලෙස ඉල්ලුම් කරන ලදි. කෙසේ වෙතත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2018 වර්ෂය සඳහා වෙන්කරන ලද අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා වැට් බදු මුදල ද ඇතුලත්ව රු. 155,128,150.60 වන (කොන්ත්‍රාත් වටිනාකමින් 20%) අත්තිකාරම් ඇපකරය මත රුපියල් මිලියන 25 ක් (5.93%) වන කොටස් මුදලක් පමණක් ගෙවීම් කරන ලදි. කොන්ත්‍රාත්කරු කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොමැති අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ගෙවිය යුතු ඉතිරි අත්තිකාරම් මුදල ගෙවන ලෙසට ඉල්ලුම් ඉල්ලුම් කරන ලදි.

නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 මැයි 06 දින පැවති රැස්වීමේදී ගත් තීරණය සහ 2019 ජුනි 05 දින නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ත්‍රිකුණාමල මණ්ඩපයේ සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ලබාදුන් උපදෙස් වලට අනුව 2019 ජුනි 22 වන දින පැවති 299 වන පාලක සභා රැස්වීමේදී ඉතා දුර්වල ප්‍රගතිය හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට නිර්දේශ කරන ලදි. අරමුදල් පවතින ආකාරයට ව්‍යාපෘතිය කොටස් වශයෙන් ක්‍රියාත්මක කිරීමට සිය කැමැත්ත පළ කරමින් කොන්ත්‍රාත්කරු ලිපියක් මගින් දන්වා සිටි අතර කොන්ත්‍රාත් වූ අවසන් කල නොහැකි බව දන්වා සිටින ලදි. මෙය 2019 ජුනි ජූලි 27 දින පැවති 300 වන පාලක සභා රැස්වීමේ අවධානයට යොමු කල අතර කොන්ත්‍රාත්තුවට අදාල කොන්දේසි 14.2 වගන්තියට අනුව කොන්ත්‍රාත්තුව මෙම අවස්ථාවේදී අවසන් කිරීමේදී ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපයට විශාල පාඩුවක් සිදුවන බව පෙන්වා දෙන ලදි. පාලක සභාව දන්වා සිටියේ සාර්ථක ප්‍රගතියක් පෙන්වීමේන් පසුව අමාත්‍යාංශයේ උපදෙස් ලබාගැනීමට යටත්ව අත්තිකාරම් මුදලේ ඉතිරිය ගෙවීමට කටයුතු කරන බව කොන්ත්‍රාත්කරු දැනුවත් කරන ලෙසයි. තවද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) 2019 සැප්තැම්බර් 16 දින ලිපියක් මගින් දන්වා සිටියේ මෙම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වලට අනුව සේවායෝජකට මෙම කොන්ත්‍රාත්තුව නීත්‍යානුකූලව අවසන් කල නොහැකි බවයි.

කෙසේ වෙතත් 2021 මැද භාගය දක්වා රටෙහි පැවැති කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් වැඩෙහි ප්‍රගතියට නැවත වතාවක් බලපෑම් ඇති වූ අතර වැඩ ප්‍රමාද විය.